## 2022 ජනවාරි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.01.24**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | වාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. වෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | චතුමිණී විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ ජනවාරි මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය, මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2021.12.13 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2021.12.13 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2021.12.13 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **සංශෝධන**

**01. ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා**

2021.12.13 දිනැති මහා සභා වාර්තාවේ පිටු අංක 12 හි තම අදහස් දැක්වීම යටතේ, සභාවට මිලදී ගන්නා සෑම ද්‍රව්‍යයක්, භාණ්ඩයක්, උපකරණයක්ම මිලදී ගැනීමේ දී ලංකාව පුරාම අප ආයතනයේ ලියාපදිංචි වී ඇති ආයතන සියල්ල වෙතින් හා හදිසි අවශ්‍යතාවයකදී ප්‍රදේශයෙන් ද මිල ගණන් ලියාපදිංචි තැපැල මගින් ලබා ගෙනද, එම ආයතන අතුරින් ප්‍රමිතියෙන් ඉහල, මිලෙන් අඩු වටිනාකමින් අඩු භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කරන ලදී. උදාහරණයක් ලෙස මේ දිනවල ලබා ගත් ලීටර් 5000 ජල බුලී සඳහන් කළ හැකිය. ආයතනයේ ලියාපදිංචි වී ඇති ආයතන හා ජල බුලී නිෂ්පාදිත ආයතන සියල්ල වෙතින් මිල ගණන් ලබා ගෙන, ප්‍රමිතියෙන් ඉහල, අඩු මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් එම ජල බුලී ලබා ගැනීමට හැකිය යනුවෙන් සහ ගරු සභාපතිතුමාගේ කාලය තුළ තමා ටෙන්ඩර් කමිටු සාමාජිකයෙකු ලෙස පත් කිරීම සිදු කර ඇති නිසා, මෙම සභා කාලය තුළ ටෙන්ඩර් ක්‍රියාවලිය විනිවිදභාවයෙන් සිදු කරන බවට තමාට සහතික විය හැකි බවත්, මෙකී කමිටු සඳහා තමා හට සහභාගී වීමට අවස්ථාව ලබා දුන් ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරන බවත් ලෙසට සංශෝධනය විය යුතුය.

**02. ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එච්. වාලි ගුණරත්න මහතා**

2021.12.13 දිනැති මහා සභා වාර්තාවේ පිටු අංක 58 හි තම අදහස් දැක්වීම යටතේ, යෝධකණ්ඩියේ පෝෂිත ප්‍රදේශයක් ඇත. එහි පරණ මාගම් ඇලේ, වල ඇලෙන් පෝෂණ ප්‍රදේශයත් පරණ මාගම් ඇලෙන් බිසෝ කොටු ඇලත් පෝෂණ වන ප්‍රදේශයන්ය. වාන් ඇල වාරි ඇලක් කර ගෙන තිබීම නිසා පරණ මාගම් ඇලේ දොර වාන් දැමීම සිදු වන්නේ නම්, දෙමෝදර ගේට්ටුව වැසිය යුතුය යනුවෙන් සංශෝධනය විය යුතුය.

**03. <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>**

2021.12.13 දිනැති මහා සභා වාර්තාවේ පිටු අංක 56 හි තම අදහස් දැක්වීම යටතේ, අප පාලන කාලය තුළ කඩ කාමර ටෙන්ඩර් කර, එම ලබා ගන්නා මුදල් වලට කුමක් සිදු කළාද යන්න මෙහිදී විමසීම් කරන ලදී. එකී ටෙන්ඩර් මුදල් අප කාලය තුළ වෙනත් ගිණුමකට බැර කර ඇති බවට ගරු සභාපතිතුමා විසින් පැහැදිලි කරන ලදී යනුවෙන් සංශෝධනය විය යුතුය.

එසේම අපගේ සභික දීමනාව මන්ත්‍රී වැටුප් අරමුදලට යොදවනු ලබයි යනුවෙන් සංශෝධනය විය යුතුය.

අප පාලන කාලය තුළ ජනතාව ගැන සිතා කඩ කාමර තක්සේරුව පිළි නොගැනීමත්, නිවැරදිව සකස් කර නොමැති නිසා කාණු පද්ධතිය භාර නොගැනීමත් නිසා විගණන මත ලැබී ඇති බව සිතිය හැකිය යනුවෙන් සංශෝධනය විය යුතුය.

**04. <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>**

2021.12.13 දිනැති මහා සභා වාර්තාවේ පිටු අංක 54 හි තම අදහස් දැක්වීම යටතේ, කොම්පෝස්ට් මධ්‍යස්ථානය සඳහා අක්කර 05 ක් දැනට තිබෙන බවත්, ඒ සඳහා අක්කර තවත් අක්කර 20 ක් ලබා දීමට තීරණය වී තිබුණත්, එකී භූමි ප්‍රමාණය ජනතාව විසින් ආක්‍රමණය කර ඇති බැවින්, ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් අවසරයක් ලබා ගෙන සභාවට ලැබීමට නියමිත භූමි ප්‍රමාණය සභාවට පවරා ගැනීමට අදාළ කටයුතු කළ යුතුය යනුවෙන් සංශෝධනය විය යුතුය.

**(අ) (ii) 2022.01.06 වන දින පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.01.06 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.01.06 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා යෝජනා කළ අතර, ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**03. <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>**

2022.01.06 දිනැති විශේෂ මහා සභා වාර්තාවේ තම අදහස් දැක්වීම යටතේ, පොදු වෙළඳපොළවල් වල ටෙන්ඩර් ලබා නොගැනීම හේතුවෙන්, ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කරන මුදලට ටෙන්ඩරය ලබා දීමට මහා සභා සම්මුතිය ලබා ගැනීමට යොමු කළත්, මෙවැනි ගැටළුවක් අප පාලන කාලය තුළ ඇති වුයේ නම්, පොදු වෙළඳපොළවල්හි ආදායම් අය කිරීම සභාවේ නිලධාරීන් යොදවා හෝ කොමිස් මුදල් මත ආදායම් අය කිරීමට කටයුතු කිරීම ආදී ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව තිබෙනවා යනුවෙන් සංශෝධනය විය යුතුය.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා, වැල්ලගේ ජීවානි මිය, චමින්ද ඩයස් වන්නිගේ මහතා, එල්.එච්. කුමුදු සුජීව මහතා එවා ඇති නිවාඩු ලිපි නිවේදනය කරන ලදී.

II. තිස්සමහාරාම ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය ඒකකයේ සංවිධානයෙන්, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සහයෝගය ඇතිව 2022.01.25 වන දින ඔසු පැළ සිටුවීමේ වැඩසටහනක් පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගන පරිශ්‍රයේදී පෙ.ව. 09.04 ට යෙදෙන සුභ මොහොතින් ආරම්භ වන බැවින්, ඒ සඳහා සහභාගී වන ලෙසට අප සභාව සඳහා එවා ඇති ආරාධනා පත්‍රය මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

## (ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන

I. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2021.12.10 දිනැති ලිපිය මගින් 2004 සිට 2008 වර්ෂය දක්වා අප ආයතන විසින් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු හිඟ මුදල වන රු. 2,133,756.00 ක් සහ දඩ මුදල වන රු. 2,146,876 ක් වූ මුළු මුදල වන රු. 4,280,633.00 ක් වූ මුදල ගෙවීම් කරන ලෙසට එම ආයතනයෙන් විසින් එවා ඇති ලිපිය මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

II. නැදිගම්විල ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, අයි.එම්.ජී.ආර්. ලංකාදරී මහත්මිය විසින් ලිපියක් මගින් දන්වා ඇත්තේ එම නිලධාරිනිය හට ස්ථිර ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයක් මේ වන තෙක් ස්ථාපිත කර ගැනීමට නොහැකි වූ බැවින්, දැනට නැදිගම්විල ආ.ම.බෙහෙත් ශාලව තුළ වෛද්‍ය සේවාව ලබා දීමේ කටයුතු සිදු කරන බවයි. කොට්ඨාසය තුළ ප්‍රජා සෞඛ්‍ය සේවය වඩාත් ඵලදායි ලෙස සිදු කිරීම සඳහා සුදුසු කාර්යාලයක් පිහිටුවා ගැනීමට අවශ්‍ය ස්ථානයක් ලබා දෙන ලෙසට එම වෛද්‍ය නිලධාරිනිය විසින් ඉල්ලීම් කර ඇති ලිපිය මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

මේ සඳහා සුදුසු ස්ථානයක් ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කිරීම සඳහා මෙම ඉල්ලීම් ලිපිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමටත්, එම ලිපියේ පිටපතක් ඉල්ලීම්කරුට යොමු කිරීමට තීරණය විය.

III. 2021.12.28 වන දින කතරගම අභිනවාරාම විහාරස්ථානයේදී ජනාධිපති පාරිසරික විශේෂ පැවරුම් හා පොලිස් පරිසර කොට්ඨාසය මගින් තංගල්ල පොලිස් කොට්ඨාසයේ සියළුම පොලිස් ස්ථාන ආවරණය වන පරිදි, පාරිසරික ගැටළු හා නගර අලංකරණය සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවේදී මල්ටි මීඩියා තාක්ෂණය ඔස්සේ තිස්සමහාරාම බල ප්‍රදේශයේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන්ද සාකච්ඡා වූ බැවින්, ඒ සඳහා ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කර සුදුසු පියවර ගැනීමටත්, මේ සඳහා පොලිස් නිලධාරීන්ගේ සහායද ලබා ගැනීමට හැකියාව ඇති බවටත් දන්වමින් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, තිස්සමහාරාම වෙතින් 2021.12.29 දින එවා ඇති ලිපිය මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එච්. වාලි ගුණරත්න මහතා**

නාග මහා විහාරය අසල තිබෙන මාලු ලැලි ඉවත් කර දෙන ලෙසට විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ ද නිරන්තර ඉල්ලීම් කරන බැවින්, මෙම මාලු ලැල්ල ඉවත් කර දීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා**

ජනාධිපති ලේකම් කාර්යාලයේ මැදිහත්වීම මත මෙම ව්‍යාපෘතිය මගින් තිස්සමහාරාම නගර අලංකරණය කිරීම නිසි පරිදි සිදු කළ හැකිය. මෙවැනි වැඩසටහන් සඳහා පොලිස් ස්ථාන වෙතින් සහාය ලබා ගැනීම කළ නොහැකි කාර්යයකි. නමුත්, ජනාධිපති ලේකම් කාර්යාලයේ මැදිහත්වීම මත සිදු කරන මෙකී වැඩසටහනත් සමඟ පොලිස් ස්ථානවලද සහාය ඇතිව නගර අලංකරණ ව්‍යාපෘතිය සිදු කිරීමට හැකි වීම සභාවට ලැබුණු හොඳ අවස්ථාවක් නිසා එමගින් උපරිමයෙන් ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා</u>

නව වෙළඳ සංකීර්ණයේ තරප්පු පෙළ (කොරිඩෝව) අසල අනවසර ඉදිකිරීමක් සඳහා සකස් කරන ලද බිත්තිය කඩා ඉවත් කිරීමට කටයුතු කර ඇතිද යන්න විමසන ලදී.

✓ මේ පිළිබඳ වැඩි දුර තොරතුරු දැන ගැනීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

මේ සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීම සඳහා කාරක සභා අවස්ථාව කැඳවූ ආදායම් පරීක්ෂක නිලධාරී සහ තාක්ෂණ සේවා නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ නව වෙළඳ සංකීර්ණයේ තරප්පු පෙළ (කොරිඩෝව) අසල සකස් කර ඇති බිත්තිය මේ වන විට කඩා ඉවත් කර ගෙන ඇති බවයි.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>නගරය පුරා තැනින් තැන අනවසර මාලු ලැලි ස්ථාපිත කර ගෙන තිබීම ගැටළුකාරී තත්ත්වයකි. ඇතැම් මාලු වෙළඳාම් කරන අයවලුන් එම අපද්‍රව්‍ය දෙබරවැව පොළට ගෙනවිත් දමනු ලබයි. සෑම දිනකම කසළ එකතු කිරීමේ සේවාව අප ආයතනයන් විසින් සිදු කළද, කඩ කාමර වසා දමන වේලාවන්ට නැවතත් එම කඩ කාමරවල කුණු කසළ මාර්ගයට බැහැර කරනු ලබයි. මේ හේතුව මත අප කොපමණ කසළ එකතු කිරීමේ සේවාව සිදු කළත්, මාර්ගයන්හි අනවසර කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය නතර නොවනු ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් සොයා බලා නීතිමය කටයුතු කළ යුතුය.</u>

<u>එසේම බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන්ද සොයා බලා මෙකී අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතුය. තවද, මෙම ඉදිකිරීම් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් රක්ෂිතවල ඉදිකිරීම් සිදු කළ ඇත්නම්, ඒවා ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කළ යුතුය.</u>

<u>නාග මහා විහාරය අසල තිබෙන මැලු ලැල්ල මාර්ග රක්ෂිතයේ සහ වාරිමාර්ග රක්ෂිතයේ පිහිටා ඇති නිසා, මෙම මාලු ලැල්ල ඉවත් කිරීමට කටයුතු කරන ලෙසටත්, බල ප්‍රදේශයේ ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් මෙම රක්ෂිතයන්වල පිහිටා ඇත්නම්, ඒවා ඉවත් කිරීමට ද කටයුතු කරන ලෙසටත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත හා මාර්ග සංවර්ධනය අධිකාරිය වෙත දන්වා යැවීම සුදුසුය.</u>

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබු යෝජනා</u>**

01. කාවන්තිස්සපුර තුරු සෙවණ අසල පිහිටි කඩ කාමර සඳහා ප්‍රධාන තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා දෙන තෙක්, තාවකාලික තක්සේරුවක් පදනම් කර ගනිමින්, එම ප්‍රදේශයේම තෝරා ගත් සුදුසු පුද්ගලයින් 15 දෙනෙකු සඳහා එම කඩ කාමර ගිවිසුම් ප්‍රකාරව මාසික කුලී පදනම මත ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

ඉහත සඳහන් යෝජනාවට වීරහෙල සුබෝධාරාමය අසල කඩ කාමර කිහිපයත් එකතු කරන ලෙසට දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථානවල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 01 | දෙබරවැව පොදු වෙළඳපොළ | 30 | එස්.එච්. විජේසිරි | එස්.එච්. නුවන් ප්‍රදීප් කුමාර | පියාගෙන් පුතාට |
| 02 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ ඉදිරිපිට කඩ කාමර | 04 | ඩී.ඩබ්. බන්දුසේන | කේ.ඩබ්. සුරන්ද | එක්වන් මුදල් අය කර |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු, රු. 181,200.00 ක මුදල ගෙවීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

<u>උප ලේඛනය</u>

| රු. 50,000.00 ඉක්මවන ගෙවීම් විස්තරය | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
| i | ZA-5200 බැකෝ ලෝඩරය සඳහා 19.5 x 24 ටයර් 02 හා ටියුබ් 02 ක් මිළට ගැනීම | ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ 14. | 2051 – 12.24 | 205,000.00 |
| ii | LA-1440 ටිපර් රථයට 750 x 16 ප්‍රමාණයේ ටයර් 05, ටියුබ් 05, රිම්ටේප් 05 ක් මිළට ගැනීම. | ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ 14. | 1599 – 12.24 | 132,000.00 |
| iii | LO-2933 ජල බවුසරය සඳහා 1100 x 20 ප්‍රමාණයේ ටයර් 01, ටියුබ් 01 මිළට ගැනීම | ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ 14. | 1600 – 12.24 | 66,950.00 |

| | | | | |
|---|---|---|---|---|
| iv | JA – 6203 ට්‍රැක්ටර් රථය සඳහා 600 x 16 ප්‍රමාණයේ ටයර් 01, ටියුබ් 01 මිළට ගැනීම | ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඞ්, කොළඹ 14 | 1598 – 12.24 | 33,200.00 |
| V | MG-330 මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීම | ආරියපාල ඔටෝ ඉංජිනියර්ස් | 7798 – 12.29 | 51,800.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. ZB-0413 දරණ කම්පැක්ටර් රථය පූර්ණ රක්ෂණය කිරීම සඳහා මිල ගණන් කැඳවා, රක්ෂණ ආයතනයක් තෝරා ගත් අතර, වැඩි ප්‍රතිලාභ හිමි රක්ෂණ ආයතනය වන පෙයාෆස්ට් රක්ෂණ ආයතනය තෝරා ගෙන ඇත. ඒ සඳහා ගෙවිය යුතු රු. 57,192.32 ක මුදල ගෙවීම් කිරීම සඳහා මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ මිලදී ගැනීමට 2022 වාර්ෂික අයවැය ලේඛනයේ 203(08)02 මගින් වෙන් කොට ඇති රු. 600,000.00 ක මුදලින් රු. 300,000.00 ක මුදලක් සඳහා ඖෂධ මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහයෙන් 2022 වර්ෂයේ පන්නෙගමුව දියබැඳිය විහාරස්ථානයේ පවත්වනු ලබන රණවිරු උපහාරාත්මක ආශිර්වාද පිංකම හා උපහාර තිළිණ ප්‍රදානය වැඩසටහන වෙනුවෙන් එම උපහාර තිළිණ නිර්මාණය කිරීම සඳහා 2022 අයවැය ලේඛනයේ 605(9)vi වැය ශිර්ෂය මගින් වෙන් කර ඇති රු. 100,000.00 ක මුදල වියදම් දැරීමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | විස්තරය | මුදල (රු) |
|---|---|---|
| 01 | උස අගල් 12, පළල 6 ½ ක ප්‍රමාණයේ ලේසර් කට් ප්ලාස්ටික් සමරු තිළිණ 01 ක් සඳහා | 8,000.00 x12 |
| සමරු තිළිණ 12 ක් සඳහා | | රු. 96,000.00 |
| පූජා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා | | රු. 4,000.00 |
| එකතුව | | රු. 100,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිළිඳු පවුල් සඳහා වැසිකිළි ඉදි කර දීම වෙනුවෙන්, 2022 අයවැය ලේඛනයේ 605(9)vi වැය ශිර්ෂය මගින් වෙන් කර ඇති රු. 520,000.00 ක මුදල වියදම් දැරීමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන පෙර පාසල් 06 හි දරුවන් සහභාගී කරවා ගෙන ලෝක ළමා දිනය වෙනුවෙන් වැඩසටහනක් පැවැත්වීම සඳහා 2022 අයවැය ලේඛනයේ 605(9)iii වැය ශිර්ෂය මගින් වෙන් කර ඇති රු. 50,000.00 ක මුදල වියදම් දැරීමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. 2022 වර්ෂයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රජා සත්කාරක ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම සඳහා 2022 අයවැය ලේඛනයේ 605(9)vi වැය ශිර්ෂය මගින් වෙන් කර ඇති රු. 75,000.00 ක මුදල වියදම් දැරීමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. 2022 වර්ෂයේ ජාතික සාහිත්‍ය හා කියවීම් මාස සැමරීම වෙනුවෙන්, 2022 අයවැය ලේඛනයේ 605(9)iv වැය ශිර්ෂය මගින් වෙන් කර ඇති රු. 100,000.00 ක මුදල වියදම් දැරීමට ප්‍රාදේශීය සභා පනතේ132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන පෙර පාසල් 06 සඳහා 2022 වර්ෂයේ අධ්‍යාපන කටයුතු හදාරනු ලබන දරුවන් හට නිල ඇඳුම් රෙදි ලබා දීම වෙනුවෙන් 2022 අයවැය ලේඛනයේ 605(09)iii වැය ශිර්ෂය මගින් වෙන් කොට ඇති රු. 200,000.00 ක මුදල වියදම් දැරීමට ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. බෝ නොවන රෝග හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා ළමා හිංසනය පිළිබඳ බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා 2022 අයවැය ලේඛනයේ 605(9)vi වැය ශිර්ෂය මගින් වෙන් කර ඇති රු. 150,000.00 ක මුදල වියදම් දැරීමට ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු දකුණු පළාත් ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාර තුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. තැන්පත් ලේඛනයේ ඇති වර්ෂ 02 ක ඉක්ම වූ තැන්පත් සභා ආදායමට ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දිනය | රිසිට්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|
| 01 | 2018.02.14 | 12427 | ප්‍රියන්ත විජේසිංහ මහතා අධ්‍යක්ෂ මහජන සම්බන්ධතා මාර්තු 2018 කොළඹ( ජාලයසිරස මාධ්‍ය) දයානන්ද .ටී.දින තිස්සමහාරාම එම් 02 හා 01 ඩාංගනය වෙන් කිරීමක් | 50000.00 |
| 02 | 2018.08.24 | 2382 | නිෂාන් චාමර ජයරත්න සේවයෙන් ඉල්ලා අස්වීමේ දී අයකරගත් අඩු කිරීම් | 14,628.00 |
| 03 | 2018.08.22 | 1002330 | PD-7489 දරණ කැබ් රථය අනතුරට පත්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් ලද වන්දි මුදල | 11,555.00 |
| 04 | 2018.07.01 | 19001710 | සීමිත සමූපකාර රක්ෂණ සමාගම රක්ෂණ වන්දි ගෙවීම තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවටඅයත් -50 කැබ් රථය අනතුරකට පත් වීම 1099 | 49,075.00 |
| 05 | 2019.03.06 | 6340 | දයානන්ද .ටී.වන දින දෙබරවැව එන් 10 මාර්තු 2019 සංගය කවිෂ්ක මහතාගේ ප්‍ර.ජී.එච්.ඩාංගනය ඩීක්‍රී පැවැත්වීමට ලබා දීමෙන් සභාවට ලද මුදල | 16,000.00 |
| 06 | 2019.03.22 | 006706 | පරිසර සංවර්ධන සැලැස්ම යටතේ දකුණු 2019 පළාත් ධීවර හා පාරිසර කටයුතු ආමාත්‍යංශය මඟින් හම්බන්තොට දිස්ත්‍රික් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ඒකරාශි කිරීම සම්බන්ධව ප්‍රචාරක කටයුතු සඳහා ලබා දුන් මුදල | 10,000.00 |
| 07 | 2019.08.01 | 008794 | බීයන්ත කපා ඉවත් කරන ලද ගස් සම්පත් ප්‍රි .ඒ.ජී. සඳහා තැන්පත් මුදල | 10,000.00 |
| 08 | 2020.12.30 | 22500 | කළමණාකරු පීපල්ස් ඉන්ෂුවරන්ස් පුද්ගලික සමාගම දරණ කැබ් රථය රක්ෂණාවරණය 1099-56 | 6,050.00 |
| **මුළු එකතුව** | | | | **167,308.00** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. කාර්යාලය තුළ මුද්‍රිත අනුබෙදුම් අයදුම්පත් නැවත ,මාණවත් නොවන බැවින්වර්ෂය සඳහා ප්‍ර 2022 ,ණය සඳහා යොමු කිරීමටමුද්‍1982 අංක (සංශෝධිත) දරණ නාගරික සංවර්ධන අධිකාරියේ 04 දරණ නාගරික සංවර්ධන 41 අංක 1978 සභාවේවන වගන්තිය හා ජාතික රාජ්‍ය 08 පනතේ වන වගන්තිය යටතේ නාගරික සං 21 අධිකාරි පනතේවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග හා රෙගුලාසි අංක 2235/කාරව ය ප්‍රවැනි දිනැති ගැසට් පත්‍ර 08 ජුලි 2021 දරණ 54 සංශෝධනය කරන ලද අනුබෙදුම් අයදුම්පත සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>දකුණු පළාත තුළ සියලුම ප්‍රාදේශීය සභාවන් හි වරිපනම්, කඩ කුලී ආදී සියලුම බදු මුදල් අන්තර්ජාලය හරහා **(On line)** ගෙවීම් කිරීමට හැකි වන පරිදි වැඩපිළිවෙලක් ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා විසින් සකස් කිරීමට අපේක්ෂා කරන බැවින්, මෙම බදු මුදල් සම්බන්ධ සියලුම තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කළ යුතුය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රධාන ස්ථානයන්හි විදුලි පද්ධති සඳහා ගෙවනු ලබන විදුලි බිල්පත් ගාස්තු වෙනුවෙන් අධික වැය බරක් දැරීම අවම කිරීම සහ ජාතික විදුලි පද්ධතියට අතිරේක විදුලි නිෂ්පාදනයක් එකතු කිරීම තුළින් සහා ආදායමට අමතර මුදලක් එකතු කිරීම සඳහා, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල, පුස්තකාල පරිශ්‍රය අසල ඇති නව බහුකාර්ය ගොඩනැගිල්ල, දෙබරවැව පොදු වෙළඳපොළ හා පන්නෙගමුව පොදු වෙළඳපොළ සඳහා විදුලිය උත්පාදනය කිරීම වෙනුවෙන් සූර්යකෝෂ විදුලි පද්ධති සවි කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>

මෙකී යෝජනාව ඉතාමත් හොද වටිනා දෙයකි. අද වන විට විදුලි අර්බුධයක් පවතින කාලයක් තුළ විදුලිය ඉතිරි කර ගැනීම සඳහා මෙලෙස කටයුතු කිරීම හොද ක්‍රියාවක් බවත්, මෙම යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසටත් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

සූර්ය කෝෂ විදුලි පද්ධති සවි කිරීම අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම අනුව ක්‍රියාත්මක වැඩපිළිවෙලකි. මෙම වැඩසටහන ඉතාමත් හොද ක්‍රියාවකි. මේ වන විට සූර්ය කෝෂ විදුලි පද්ධති සවි කිරීම සඳහා විදුලි බල මණ්ඩලය වෙත ඉල්ලුම්පත් රැසක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා සූර්ය පැනල ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටි නමුත්, මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයක් පවතී. මෙය මෙසේ ප්‍රමාදවීම් සිදු වන්නේ අදාළ නිලධාරීන් අතින් සිදු වන අඩුපාඩුකම් නිසා බව කිව හැකිය. මේ සම්බන්ධයෙන් ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා සාකච්ඡා කරන ලදී. එම නිසා මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කර, මෙම වැඩපිළිවෙල කඩිනම් කිරීමට අදාළ කටයුතු සිදු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>

තෙකලා විදුලි බලය ලබා ගැනීමේ දී ට්‍රාන්ස්පෝමරයට මීටර් 800 ක් දුරින් පවතින නිවාසවලට පමණක් තෙකලා විදුලි බලය ලබා ගැනීමේ හැකියාව පවතී. එය එසේ වුවහොත්, එම දුර ප්‍රමාණයෙන් එපිටට සිටින ජනතාවට සිදු වන්නේ අසාධාරණයකි. එම නිසා සූර්යකෝෂ පද්ධති සවි කිරීමට අවශ්‍ය සියලුම දෙනාට එම විදුලි බලය ලබා ගත හැකි වන පරිදි, ලබා ගත හැකි දුර ප්‍රමාණය තවත් වැඩි කිරීම නම්, ට්‍රාන්ස්පෝමරයේ ධාරිතාවද වැඩි කළ යුතු බවත්, එමගින් මෙම සූර්යකෝෂ පද්ධති අවශ්‍ය සියලුම ජනතාවට ලබා ගත හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙල ඉතාමත් වැදගත් වැඩපිළිවෙලකි. අප රටේ විදුලිය උත්පාදනය කරන ප්‍රධාන මාධ්‍ය වන්නේ ජල විදුලියයි. මේ වන විට ප්‍රධාන ජලාශවල ජලය සීඝ්‍රයෙන් හිඳී යයි. නියමිත මාස් මෝසම්, යල් මෝසම් වර්ෂාවන් නොලැබීම නිසා ජල

පෝෂක ප්‍රදේශවලට ජලය නොලැබී හේතුවෙන් ජලය සීඝ්‍රයෙන් පහල වැටීමක් සිදු වේ. එසේ සිදුවුවහොත් විකල්ප ක්‍රියාවලීන්ට යා යුතුය. එහි එක් පැත්තක් ලෙස ගල් අඟුරු හා ඉන්ධන මගින් ක්‍රියාත්මක කරන බලාගාර දැක්විය හැකිය. මේ දෙකෙහිම අර්බුධකාරී තත්ත්වයක් උද්ගත වී ඇත. ඒ සඳහා හොඳම විසඳුමක් ලෙස තාප බලාගාර ඉදිකිරීම, සූර්ය කෝෂ සවි කිරීම කළ යුතුය. ඒ සඳහා ක්‍රියාත්මක වීමේ දී ප්‍රමාද වන ප්‍රධාන හේතුව වන්නේ විදුලි බල මණ්ඩලයේ ඉහල තලයේ නිලධාරීන්ට තාප බලාගාර තිබෙන නිසා, ඔවුන්ට මෙමගින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මෙවැනි යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමයි. මෙකී කටයුතු නතර කිරීම අතිගරු ජනාධිපතිතුමාට හැකියාව පවතී. අද රටේ මෙලෙස සිදු කරන සංවිධාන රජය යටපත් කර ගනිමින් එම සංවිධාන කටයුතු සිදු කරන අවස්ථාවන්ද තිබෙනු ඇත. එමනිසා මේ සම්බන්ධයෙන් ඍජුවම අතිගරු ජනාධිපතිතුමා වෙත සම්බන්ධීකරණය කර ගෙන, මෙම විදුලි මාපියා සම්පූර්ණයෙන්ම තුරන් කර මෙම සූර්යකෝෂ විදුලි පද්ධතිය රට පුරාම ක්‍රියාත්මක කිරීමට හැකි නම්, විදුලිය පිරිමසා ගත හැකි වන බවත්, අඳුරේ සිටීමට සිදු නොවන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම එමගින් විදුලි මාපියාව සම්පූර්ණයෙන්ම නතර කර දැමීමට ද හැකි වන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සූර්ය කෝෂ විදුලි පද්ධති සඳහා වැඩි ප්‍රමාණයක් ඉල්ලුම් කළද, අදාළ ප්‍රදේශයේ පවතින ට්‍රාන්ස්පෝමරයට දරා ගත හැකි ධාරිතාවේ ප්‍රමාණය පිළිබඳව විදුලි බල මණ්ඩලය මගින් පරීක්ෂා කර බැලු පසුව, එහි පවතින ධාරිතා ප්‍රමාණයන් අනුව ඉල්ලුම්කරුවන්ට සූර්ය කෝෂ විදුලි පද්ධති සවි කර ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## ❖ <u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>

- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

17. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2021.12.10 දිනැති ලිපිය මගින් 2004 සිට 2008 වර්ෂය දක්වා අප ආයතන විසින් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු හිඟ මුදල වන රු. 2,133,756.00 ක් සහ දඩ මුදල වන රු. 2,146,876 ක් වු මුළු මුදල වන රු. 4,280,633.00 ක් වු මුදල ගෙවීම් කරන ලෙසට එම ආයතනයෙන් දන්වා ඇති බැවින්, මෙම මුදල් ගෙවීම් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

✓ මේ පිළිබඳ සවිස්තර තොරතුරු දැන ගැනීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

❖ <u>ලේකම් - ඩී. රුවිනා දීපානි මහත්මිය</u>

2004 සිට 2008 දක්වා අප ආයතනය විසින් ගෙවීම් කරන ලද එකතු කළ අගය මත බදු මුදල් කාර්තු වශයෙන් ගෙවීම් සිදු කර ඇත. උක්ත කාලය තුළ ගෙවිය යුතු හිඟ මුදල් සහ එම මුදලට දඩ මුදල් ලෙස දක්වමින්, රු. 4,280,633.00 ක මුදලක් ගෙවීමට ඇති බව දන්වමින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2021.12.10 දිනැතිව අප ආයතනය වෙත ලිපියක් මගින් දන්වා ඇත. එම කාලය තුළ බදු මුදල් සම්බන්ධ ලේඛන කිසිවක් ලේඛනාගාරය තුළ හෝ නොමැති බවත්, එම නිසා මේ සම්බන්ධව තොරතුරු කිසිවක් ආයතනය තුළ සොයා ගත නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

2013.01.01 දින සිට අප ආයතනය එකතු කළ අගය මත බදු ලියාපදිංචියෙන් නිදහස් කර ඇති අතර, පාරිභෝගිකයන්ගෙන් එකතු කළ අගය මත බදු අය නොකරන බවද වැඩි දුරටත් දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා**

අප පාලන කාලය තුළ සාධාරණ හේතූන් මත යම් යම් ව්‍යාපෘති සඳහා ගෙවීම් නොකිරීමට තීරණයක් ලබා ගත්තේ නම්, ඒ සඳහා සභා තීරණ ලබා ගෙන ඊට අදාළ ගෙවීම් සිදු නොකරීමට කටයුතු කරන ලදී. නමුත්, එකතු කළ අගය මත බදු මුදල් නොගෙවා සිටීම සභා තීරණයක් මගින් සිදු කළ නොහැකි කාර්යයකි. අප පාලන කාලය තුළ මෙම මුදල් නොගෙවීම සම්බන්ධයෙන් කිසිදු සභා තීරණයක් ලබා ගෙන නොමැති බව වැඩි දුරටත් සඳහන් කරන ලදී. එසේම, 2004 සිට 2008 දක්වා කාලය තුළට මෙම මුදල් ගෙවීමට ඇත්නම්, එම කාලය තුළ මේ සම්බන්ධයෙන් අප ආයතනය දැනුවත් නොකර, විශාල මුදලක් එකතු වූ පසුව එකී මුදල් ගෙවීමට කටයුතු කරන ලෙසට මෙම කාලයේ දැනුවත් කිරීමට කටයුතු කිරීමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සිදු වූ අඩුපාඩුවක් බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා**

2004 සිට 2008 දක්වා එකතු කළ අගය මත මුදල් ගෙවීම සම්බන්ධයෙන් ලේඛන නඩත්තු නොකිරීම එවක සිටි නිලධාරීන් අතින් සිදු වූ අඩුපාඩුවක් නිසා මෙකී කාරණය සඳහා ගරු මහා සභාවේ ගරු සභිකයින් වන අප සියලුම දෙනා කිසිදු අධි භාරයකට ලක් නොවන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

2004 සිට 2008 කාලයේ එකතු කළ අගය මත බදු ගෙවීම් සම්බන්ධ ලේඛන නඩත්තු නොවීම එම කාලයේ පරිපාලනය තුළ පැවැති අඩුපාඩුවකි. එසේම 2004 සිට 2008 දක්වා කාලය තුළ ගෙවීමට තිබූ මෙම මුදල් සම්බන්ධයෙන් එම කාලය තුළ දැන්වීමක් සිදු නොකර, මෙලෙස විශාල මුදලක් එකතු වූ පසුව ගෙවීම් කරන ලෙස දැන්වීම් සිදු කළද, අප පාලන කාලය තුළ මෙම මුදල් ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති බව දන්වා සිටින ලදී.

පසුගිය වර්ෂයන් තුළ ප්‍රා.ස වාර්තා නිසි ලෙස සකස් වී නොතිබුණ නමුත් අප පාලන කාලය තුළ ප්‍රා.ස වාර්තා දෛනිකව මාසිකව නිවැරදිව සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදී. ඒ තුළින් අප ආයතනයේ ගිණුම් නිවැරදිව පවත්වාගෙන යාමට අපට හැකි වී ඇත.

අප කාලය තුළ ජාතිය ගොඩ නැගීමේ බදු මුදල් ගෙවීම් කිරීම නිසි පරිදි සිදු කර ඇත. එම නිසා පසුගිය කාලයන්වල මෙසේ එකතු කළ අගය මත නොගෙවන ලද බදු මුදල් ගෙවීමේ වගකීම අප පාලන කාලය තුළ සිදු කළ නොහැක. අප කාලය තුළ කිසිදු අඩුපාඩුවකින් තොරව නිවැරදිව කටයුතු සිදු කර ඇති බවත් සඳහන් කරන ලදී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කළ අගය මත අය කරන ලද බදු මුදල්වල එක් වර්ෂයකට අදාළ මුදලින් හිඟයක් පවතින්නේ නම්, එකී මුදල ගෙවන ලෙසට ඊළඟ වර්ෂයේ හෝ දැන්වීමට කටයුතු කළ යුතු වුවත්, එසේ නොමැතිව 2004 සිට 2008 කාලය ඉක්මවා වසර 14 ක් පමණ ගත වූ පසු හිඟ මුදලට සමාන තරම් වූ ප්‍රමාණයකම දඩ මුදලක් ද සහිතව ගෙවිය යුතු හිඟ මුදල දැන්වීම එම ආයතනය මගින් ද සිදු වී ඇති අඩුපාඩුවකි.

2004 සිට 2008 දක්වා කාල පරාසය තුළ, එකතු කළ අගය මත බදු මුදල් ගෙවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිපියට අනුව, මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කළත්, අද දින ගරු මහා සභාවේ සියලුම දෙනාගේ අදහස් සලකා බලමින්, මෙකී මුදල් නොගෙවා සිටීම එම කාලයේ පරිපාලන තුළ සිදු වූ අඩුපාඩුවක් බවත්, මෙලෙසට ඉහත කී වර්ෂයන්වලට අදාළ හිඟ මුදල් ගෙවීම් කරන ලෙසට එම කාලය තුළදීම අප ආයතනය දැනුවත් නොකර, 2021.12.10 දිනැතිව ලිපියක් යොමු කර උක්ත කාලය තුළ ගෙවිය යුතු හිඟ මුදල් සහ එම මුදලට දඩ මුදල් ලෙස දක්වමින්, රු. 4,280,633.00 ක විශාල මුදලක් ගෙවීමට කටයුතු කරන ලෙස දැන්වීම එම ආයතනය වෙතින් ද සිදු වූ විශාල අඩුපාඩුවක් බැවින්, මෙකී සියලු කරුණු සළකා බලමින්, 2004 සිට 2008 වර්ෂය දක්වා කාලයට අදාළ වූ, එකතු කළ අගය මත ගෙවිය යුතු බදු හිඟ මුදල් ගෙවීමට අප පාලන කාලය තුළ කිසිදු හැකියාවක් නොමැති බවට මහා සභාවේ ඒකමතිකව තීරණය කරන ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

18. 2022 වර්ෂයේ හා 2021 වර්ෂයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දේපළ ටෙන්ඩර් ලබා ගැනීමේදී තැන්පත් කරන ලද 25% ආරක්ෂිත ඇප තැන්පතු හා ටෙන්ඩර් තැන්පතු නිදහස් කර අදාළ ආදායකයන් හට ගෙවීමට හා 2021 වර්ෂයේ දී ටෙන්ඩර් දේපළවල හිඟ වාරිකව පැවැති ටෙන්ඩර් අයදුම්කරුවන්ගේ ඇප තැන්පතු ඔවුන්ගේ ඉල්ලීම මත, හිඟ වාරික මුදල් අය කර ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | හිඟ වාරික මුදල (රු) | ආදායකයාට ගෙවන මුදල(රු) |
|---|---|---|---|---|
| 01 | ඩබ්.පී. විමලසේන | 2022 වර්ෂයේ ටෙන්ඩර් දේපළ තැන්පතු | | 100,000.00 |
| 02 | එස්.එන්. විජේසිංහ | 2022 වර්ෂයේ ටෙන්ඩර් දේපළ තැන්පතු | | 50,000.00 |
| 03 | වී.ඒ. රංජිත් | 2022 වර්ෂයේ ටෙන්ඩර් දේපළ තැන්පතු | | 50,000.00 |
| 04 | එන්.ජී. කීර්තිරත්න | 2022 වර්ෂයේ ටෙන්ඩර් දේපළ තැන්පතු | | 50,000.00 |
| 05 | එම්.එල්. නිලංක සංජීව | 2022 වර්ෂයේ ටෙන්ඩර් දේපළ තැන්පතු | | 50,000.00 |
| 06 | සමිත් මදුසංඛ වීරකෝන් | 2022 වර්ෂයේ ටෙන්ඩර් දේපළ තැන්පතු | | 5,000.00 |
| 07 | එන්.ජී. කීර්තිරත්න | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 590,750.00 | |
| 08 | වී.ඒ. රංජිත් | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 728,000.00 | |
| 09 | කේ. වේලු | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 30,000.00 | |
| 10 | කේ. වේලු | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 833.33 | 2,916.67 |
| 11 | දිලුම් තාරක | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 36,800.00 | 4,600.00 |
| 12 | කරුපන් ඉන්ද්‍රානි | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 34,050.67 | 4,256.33 |
| 13 | වැල්ලගේ සිරිසේන | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | | 2,002.50 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | මීපා පුංචිහේවා | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 1,025.00 | |
| 15 | ඒ.පී. සුදත් | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 30,000.00 | |
| 16 | ඊ.සී. රාජපක්ෂ | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | 3,750.00 | |
| 17 | පී.ඒ. ගාමිණී | 2021 වර්ෂයේ ටෙන්ඩර් දේපළවල හිඟ වාරික මුදල් අය කර ගැනීම | | 2,018.75 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

19. දේශීය විදේශීය සංචාරකයින්ගේ පහසුව සඳහා තිස්සමහාරාම වැව් කණ්ඩිය අසල දැන්වීම් පුවරු සකස් කිරීම සහ කසල බඳුන් සකස් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය ලයිස්තුව මිල ගණන් කැඳවා මිලදී ගෙන, එකී කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩය | අවශ්‍ය ප්‍රමාණය | |
|---|---|---|---|
| | දැන්වීම් පුවරු සඳහා | | |
| 01 | GI -18 ගේජ් තහඩු | 01 | |
| 02 | 2 1 ප්‍රමාණයේ ස්ටිකර් | 10 | |
| 03 | GI – 1 ¼ (1.2 mm) බට | 05 | |
| 04 | BOX BAR – 1 x 1(1.2 mm) බට | 05 | |
| 05 | ඇලුමිනියම් L Bar (12.5 X 12.5 mm) | 05 | |
| 06 | කැන්වස් ස්ටිකර් (3 2 ) | 05 | |
| | කසල බඳුන් සකස් කිරීම සඳහා (එක් බඳුනක් සඳහා) | | |
| 07 | GI – 1 ¼ බට | 10 | |
| 08 | 2 x 2 GI කොටු දැල් (8 4) ප්‍රමාණයේ | 05 | 10 |
| 09 | Zn/Al ප්‍රමාණයේ තහඩු (0.47) | අඩි 80 | |
| | සියළුම උපාංග සවි කිරීම සඳහා | | |
| 10 | සිමෙන්ති බෑග් | 03 | |
| 11 | ගල් | කියුබ් ¼ | |
| 12 | වැලි | කියුබ් ¼ | |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>

තිස්සමහාරාම වැව් කණ්ඩියේ කෙළවරේ වැසිකිළි පද්ධති සකස් කර ඇති නිසා, හදිසි අවශ්‍යතාවයක් ඇති වුවහොත්, එම අවශ්‍යතාවය සිදු කර ගැනීම සඳහා කි.මී. 01 ක පමණ දුරක් යාමට ජනතාවට සිදු වීම ඉතාමත් අපහසු කාර්යයක් බැවින්, මෙහි අවශ්‍යතාවයට අනුව සුදුසු ස්ථානයක් තෝරා තවත් වැසිකිළියක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එච්. වාලි ගුණරත්න මහතා**

යෝධකණ්ඩිය වැව අසල තිබෙන පරණ වැසිකිළිය කඩා ඉවත් කර, නව වැසිකිළියක් සකස් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

තිස්සමහාරාම වැව් කණ්ඩියේ අකුරුගොඩ තොරණ අසලට මෙම දැන්වීම් පුවරු සවි කිරීමට තීරණය කර ඇති අතර, ඉදිරියේ දී වීරවිල, යෝධකණ්ඩිය වැව් කණ්ඩි සඳහාද දැන්වීම් පුවරු සවි කිරීමට අපේක්ෂා කර බවත් ප්‍රකාශ කරන ලදී. වීරවිල වැවේ නාන තොටුපල (හිල්ටන් හෝටලය ඉදිරිපිට) විධිමත් පරිදි සකස් කිරීමට ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා තීරණය කර ඇති බවත් දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

20. ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා HD68 ඔයිල් සැපයීම සඳහා සභාවට ඔයිල් බැරලයක් මිලදී ගැනීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**

- **ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එච්. වාලි ගුණරත්න මහතා**

21. යෝධ වැව රක්ෂිතය ගොඩ කර හෝටලයක් ඉදිකිරීම සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉඩම් හා නීති) විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත 2021.11.30 දිනැතිව යොමු කරන ලද ලිපිය අනුව, යෝධ වැව රක්ෂිතය ගොඩ කර හෝටලයක් ඉදිකිරීම සම්බන්ධව පරීක්ෂා කර බලා නිරීක්ෂණ සහ ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිලිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට වැඩ පොදු හා ගොඩනැගිලි සේවා අංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 07 යන ලිපිනයට යොමු කරන ලද ලිපියේ පිටපතක් මා වෙතද යොමු කර ඇත. එබැවින් මේ සම්බන්ධයෙන් අප ආයතනයේ ද අවධානය යොමු කර, මෙකී ඉදිකිරීම වහාම නතර කිරීමට කටයුතු සිදු කළ යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. තිස්සමහාරාම, පොල්ගහවැලැන ග්‍රාම නිලධාරී වසමට අයත් අක්කර 100 ප්‍රදේශයේ ජීවත්වන පවුල් සංඛ්‍යාව 60 කට ආසන්න වේ. මෙම ප්‍රදේශවාසීන්ගේ ගමනාගමනය සඳහා ඇති බොරලු පාර වර්ෂා කාලයට මඩ ගොහොරුවක් බවට පත් වන බවත්, එම පාරේ වළවල් බහුල නිසා විවිධ අනතුරු සිදු වු වාර අනන්ත බවටත් දන්වා පොල්ගහවැලැන ප්‍රදේශවාසීන් විසින් දන්වා ඇත. මෙකී මාර්ගය සකස් කර දෙන ලෙසට කාලයක් තිස්සේ මේ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කළද, නිසි පිලියමක් ලබා ගැනීමට නොහැකි වු බැවින්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, අක්කර 100 පාර පිළිසකර කර දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

23. අප ප්‍රදේශයේ ප්‍රධාන ජීවනාලිය බඳු යෝධ වැවේ, වැව් රක්ෂිතය ගොඩ කිරීමද වැව තුළ බෙන්ස් වළවල් හාරා දැල් වැටක් ඉදි කර නාන තොටුපල අවහිර කිරීම සම්බන්ධව 2021 ඔක්තෝම්බර් මාසයේ පැවැති මහා සභාව දැනුවත් කර එයට විරුද්ධව අදහස් ප්‍රකාශ කළ අතර, එදින සවස මන්ත්‍රී කණ්ඩායමක්ද ගොවි සංවිධාන ධීවර සමිති නිලධාරීන් ඇතුළු මාධ්‍යවේදීන් සමඟ ස්ථානීය පරීක්ෂාවක් සිදු කළ බවත්, උද්ධකන්දර වීර උදාර ගොවි සංවිධානය මගින් දේශපාලන අධිකාරියද, දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමිය, වාරිමාර්ග ඉංජිනේරුතුමා, ගොවිජන සේවා නිලධාරීතුමිය ප්‍රධාන සියලු රාජ්‍ය නිලධාරීන්ටද ගොවි සංවිධාන සහ ස්වේච්ඡා සංවිධාන ද ලිඛිතව දැනුවත් කරන ලදී.

2021.12.17 දින ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කළ ලිපියේ පිටපතක් අදාළ ගොවි සංවිධානයට ලැබුණු අතර, එම ලිපියේ සඳහන් වන ප්‍රධාන කරුණු ලෙස ඉදිකිරීම් තාවකාලිකව නවතා ඇතත්, ඉදි කර ඇති දැල් වැට මේ වන තෙක් ඉවත් කර ගෙන නොමැති බවත්, ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කිරින්ද පොලිසියේ පැමිණිල්ලක් දමා දැනට මාස කිහිපයක් ගත වුවත්, මේ වන තෙක් කිසිදු රාජකාරියක් සිදු වී නොමැති අතර, එකී ලිපිය මේ සමඟ සභා ගත කරන බවත්, ඒ සඳහා කඩිනමින් ඉදිරි පියවර ගැනීම සඳහා අදාළ අමාත්‍යවරුන්ට හට, වාරි අධ්‍යක්ෂ ජනරාල් තුමාට සහ අදාළ පොලිස් නිලධාරීන් වෙත දැනුවත් කර එහි ප්‍රතිඵල අදාල ගොවි සංවිධාන වෙත දැනුවත් කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එච්. චාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

යෝධ වැව රක්ෂිතය අල්ලා ගැනීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා, එම ස්ථානයට තමා ඇතුළු පිරිසක්ද සහභාගී වන ලදී. මේ සම්බන්ධයෙන් වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් කිරින්ද පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදු කළද, එම පොලිස් ස්ථානය වෙතින් මේ දක්වා ඒ සඳහා කිසිදු ක්‍රියාත්මක වීමක් සිදු වී නොමැත. එම නිසා මේ සම්බන්ධයෙන් දැඩි තීරණයක් ලබා ගෙන මෙකී කටයුත්ත නවතා දැමීමට කටයුතු කළ යුතුය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

24. උද්ධකන්දර ග්‍රාම නිලධාරී වසම ප්‍රධානව, තිස්සමහාරාම ප්‍රදේශයේ මාර්ග විශාල ප්‍රමාණයක මාර්ග රක්ෂිතද ජල කාණුද අවහිර කර යම් පුද්ගලයන් විසින් වැටවල් ගසා ඇත. තවද වැටේ සිටුවා ඇති ගස්වල අතු පාර දෙපස අවහිර වන පරිදි තාර, කොන්ක්‍රීට්, ඉන්ටර්ලොක් සහ බොරලු මාර්ග දෙසට වන සේ වැවී ඇත. මේ සම්බන්ධයෙන් අදාළ ග්‍රාම නිලධාරී දැනුවත් කළද, ඒ සඳහා රාජකාරියක් සිදු වීම මන්දගාමී තත්ත්වයක පැවතුණි. 2011 වසරේ සිටම ප්‍රාදේශීය සභා යෝජනා ලෙස ගරු සභිකයින් කිහිප දෙනෙකුම ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළද, මේ වන තෙක් කිසිදු විසඳුමක් නොලැබීම කණගාටුවට කරුණකි. කෙසේ වුවත්, මේ හේතුව මත අභිමානවත් වූ ජාතියක මිනිසුන්ට නිදහසේ ගමන් කිරීමට තිබෙන අවස්ථාවද නැති වී යනු ඇත. එබැවින්, මේ සම්බන්ධයෙන් ඉතා කඩිනමින් අදාළ නිලධාරීන් හා ආයතන දැනුවත් කර, මේ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එච්. චාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

ගරු සභාපතිතුමාගේ කාලය තුල එතුමන් විසින් තිස්සමහාරාම බල ප්‍රදේශයට විශාල වැඩ කොටසක් සිදු කර ඇත. එලෙසට තවත් සිදු කළ යුතු සුවිශේෂී කාර්යක් වන්නේ කොට්ඨාසයන්හි පවතින

මාර්ගයන්වල රක්ෂිතයන්ද අල්ලා වැට මායිම් ගැසීම සම්බන්ධයෙන්ද විශේෂ අවධානයක් යොමු කර කටයුතු කිරීමයි. ගරු සභාපතිතුමා ජනතාව වෙනුවෙන් සිදු කරන ලද සෑම ක්‍රියාවක්ම ඉතිහාස ගතවනවා සේම, මෙම කරුණ සම්බන්ධයෙන්ද අවධානය යොමු කර, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළහොත්, එයද ගරු සභාපතිතුමා බල ප්‍රදේශය වෙනුවෙන් සිදු කළ නිවැරදි ක්‍රියාවක් ලෙස ඉතිහාස ගත වනු ඇත.

මෙම ක්‍රියාව සඳහා ස්ථිරව ක්‍රියාමාර්ගයක් ගන්නා තෙක්, තාවකාලික විසඳුමක් ලෙස වැට මායිම්වල වැවී ඇති ගස් කපා දැමීමට ගම්වල ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසට අදාළ වසම්හි ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම සුදුසු වේ.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එච්. වාලි ගුණරත්න මහතා**</u>

මාර්ග රක්ෂිත අල්ලා ඉඩම්වල වැට මායිම් සකස් කර ඇති අයවලුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම අනිවාරයෙන්ම සිදු කළ යුතු ක්‍රියාවකි. අප පාලන කාලය තුළ මෙම කරුණ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට හැකි වුවහොත්, එහි ගෞරවය අප සියලුම දෙනාට හිමි වනු ඇත.

❖ <u>**ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>කොට්ඨාස 13 හිම පවතින මාර්ගයන් අල්ලා ගනිමින් ඉඩම්වල වැටවල් ගසා ඇති නම් සහ මාර්ග රක්ෂිත අල්ලා ගනිමින් තාප්ප ඉදි කර ඇත්නම්, තාප්ප කඩා ඉවත් කිරීමටත්, ගසා ඇති වැටවල් ඉවත් කිරීමටත් සභාව සතුව බලය පවතී. එම නිසා ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත දන්වා කොට්ඨාසයන්හි පවතින මාර්ගයන්වල, මාර්ග රක්ෂිත වෙන් කර දීමට අදාළ කටයුතු සිදු කරන ලෙසට දැන්වීම සුදුසු බවට තීරණය කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>**රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

- <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා**</u>

25. ගෝණගමුව ග්‍රාම නිලධාරී වසමේ වරාපිටිය ග්‍රාමයේ ප්‍රදේශවාසීන් විසින් වීරකැටිය ගෙදර යනුවෙන් අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන මාගේ පියාගේ මහගෙදර ඉඩමේ සුසාන භූමිය ඉදිරිපිට බිම් කොටස මා විසින් මීට වසර 16 කට පමණ පෙර ගරු සජිත් ප්‍රේමදාස එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අනුග්‍රාහක දායකත්වයෙන් පෙර පාසලක් ඉදි කර එම පෙර පාසල වරාපිටිය එකමුතු ග්‍රාමෝදය පෙර පාසල යනුවෙන් නම් කර ප්‍රදේශවාසීන්ගේ දූවා දරුවන්ට පූර්ව ළමාවිය අධ්‍යාපනය ලබා දීමට මා විසින් පරිත්‍යාග කරන ලදී.
එම පෙර පාසල දැනට දරු දැරියන්ගේ මව් හවුලේ උදව් උපකාර ඇතිව ඉතා අසීරුවෙන් පවත්වාගෙන යනු ලබයි. ඉහත පෙර පාසල සහිත භූමි භාගය තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට පවරා විධිමත් ලෙස එය පවත්වාගෙන යාමට මා අදහස් කරන බැවින්, එම පෙර පාසල සහිත භූමි භාගය තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත දන්වා, ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු යොදන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>**රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

- <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය**</u>

26. 2022 වර්ෂයේ සිදු කළ යුතු සංවර්ධන යෝජනා යටතේ තම කොට්ඨාසයේ සංවර්ධනය කළ යුතු මාර්ග සහ විදි පහන් අවශ්‍යතාවය පරිදි ලබා දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

➢ **සංවර්ධනය කළ යුතු මාර්ග**

I. සඳුන්ගම ග්‍රාම නිලධාරී වසමේ පිදුම්ගල මාවතේ ඉතා අබලන් තත්ත්වයේ පවතින මීටර් 300 ක් පමණ මාර්ගය බොරලු දමා සංවර්ධනය කිරීම.
II. දඹේවැලැන ආලෝක මාවතේ මැද කොටස අඩි 100 ක් පමණ බොරලු යොදා සංවර්ධනය කිරීම.
III. ආතර් මාවතේ වළවල් බොරලු දමා ගොඩ කර, බොරලු දමා සංවර්ධනය කිරීම.
IV. මහින්දපුර 01 ඇල පාර මීටර් 300 ක් පමණ බොරලු දමා සංවර්ධනය කිරීම.
V. දඹේවැලැන බොරලු පාර ජයතිස්ස මහතාගේ නිවස අසල සිට ප්‍රධාන කාණුවේ ඉතිරි කොටස පැති බැම්ම සංවර්ධනය කිරීම.
VI. එකමුතුගම කුංචනාද මාවතේ ඉතිරි කොටස බොරලු දමා සංවර්ධනය කිරීම.

➢ **විදි පහන් අවශ්‍යතාවය**

I. විජිතපුර තිලකදාස මහතාගේ නිවස ඉදිරිපිට විදුලි කණුවට විදි පහනක් සවි කිරීම.
II. දඹේවැලැන බොරළු පාර ජයතිස්ස මහතාගේ නිවස ඉදිරිපිට කණුව සඳහා විදි පහනක් සවි කිරීම.
III. අංජලිගල පළමු පටුමග මීටර් 400 ක ප්‍රමාණය විදි පහන් 03 ක් සවි කිරීම. (නිහාල් මහතාගේ නිවස ඉදිරිපිට, කරුණාදාස මහතාගේ නිවස ඉදිරිපිට, සේනානායක මහතාගේ නිවස ඉදිරිපිට)
IV. මදච්ච අශෝක මහතාගේ නිවස ඉදිරිපිට කාණුව සඳහා විදි පහනක් ලබා දීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණි මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.01.04 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.
සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.01.04 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.
සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.01.04 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.01.04 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතාගේ අදහස් දැක්වීම**

දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා අවසර ලබා දී ඇත්ද යන්න විමසීම් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

මේ වන විට දෙබරවැව පොදු ක්‍රීඩාංගනය නඩත්තු කටයුත්තක පවතින බැවින්, ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණි මහතාගේ ඉල්ලීම පරිදි, සභාවට ද ආදායමක් ලබා ගැනීම සඳහා එම නඩත්තු කාලයට පමණක් සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා අවසර ලබා දුන් බවත්, එම කාලය තුලදී පමණක් සංගීත ප්‍රසංග සඳහාත් වෙනත් උත්සව පැවැත්වීම සඳහාත් ලබා දීමට තීරණය කරන ලදී. මෙම ක්‍රීඩාංගනය විධිමත් පරිදි නඩත්තු කළ පසුව කිසිදු උත්සවක් හෝ සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට අවසර ලබා නොදෙන බවත්, ඉන් පසුව ක්‍රීඩා කටයුතු සඳහා පමණක් ක්‍රීඩාංගනය ලබා දීමට කටයුතු කරන බවටත් දන්වා සිටින ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා**

දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ ජාතික තලයේ ක්‍රීඩා පුහුණුවීම් කරන දරුවන් සිටින බැවින්, සංගීත ප්‍රසංග සඳහා ලබාදුන්හොත්, මෙම ක්‍රීඩාංගනය විනාශ වී එමගින් ක්‍රීඩා කරන දරුවන්ට ද හානි සිදු විය හැකිය. මෙම ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංගයක් සඳහා ලබා දීම සම්බන්ධයෙන් තමා පෞද්ගලිකව විරුද්ධ වනු ඇත. නමුත් සභාවක් ලෙස සංගීත ප්‍රසංග සඳහා මෙම ක්‍රීඩාංගනය ලබා දීමට යම් තීරණයක් ගන්නේ නම්, දේශපාලන රැස්වීම් පැවැත්වීම සඳහා ද අවස්ථාව ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා**

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය මේ වන විට සිදු කරන නඩත්තු කටයුත්තේ දී ක්‍රීඩා කරන අය සඳහා සියලුම පහසුකම් වලින් යුතුව සකස් කිරීමට ක්‍රීඩා අමාත්‍යාංශය විසින් කටයුතු සිදු කරනු ඇත. එම නිසා එම නඩත්තු කාලය තුලට පමණක් දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ සංගීත ප්‍රසංගය සහ වෙනත් උත්සව කටයුතු පැවැත්වීම සඳහා අවසරය ලබා දීම සුදුසු බවට දන්වා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>**

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංග සඳහා ලබා නොදීමට මීට පෙර මහා සභා තීරණයක් ලබා ගෙන ඇති බැවින්, මේ අවස්ථාවේ සංගීත ප්‍රසංගයක් සඳහා ක්‍රිඩාංගනය ලබා දීම සම්බන්ධයෙන් තමා විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. වාලි ගුණරත්න මහතා</u>**

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංග සඳහා සහ වෙනත් උත්සව කටයුතු සඳහා ලබා නොදීමට මීට පෙර කාලයන්වලදීද සභා තීරණයත් ලබා ගන්නා ලදී. මහා සභා තීරණයක් ලබා ගෙන ඇති බැවින්, මේ අවස්ථාවේ සංගීත ප්‍රසංගයක් සඳහා ක්‍රිඩාංගනය ලබා දීම සම්බන්ධයෙන් තමා එකඟ නොවන බව ප්‍රකාශ කරන ලදී.

එසේම මෙම ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංග සඳහා ලබා දීම මෙකී නඩත්තු කාලයට පමණක් සිදු කිරීමටත්, එම නඩත්තු කාලයෙන් පසුව කිසිදු හේතුවක් මත ක්‍රීඩා කටයුතුවලට හැර වෙනත් කිසිදු කටයුත්තක් සඳහා ලබා නොදීමටත් තීරණය කළ යුතුය.

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය පිහිටි භූමිය පවරා ගැනීම් සිදු කරන තිස්සමහාරාමයට ලබා ගන්නා ලද්දේ පී.එම්.බී. සිරිල් මැතිතුමා විසින්ය. එම මැතිතුමාගේ මැදිහත්වීම හා දායකත්වය මත තිස්සමහාරාමයට පොදු ක්‍රීඩාංගනයක් ලබා ගැනීමට හැකි විය. අප ප්‍රදේශයට එවැනි වටිනා සම්පතක් ලබා ගැනීමට දායක වීම සම්බන්ධයෙන් එතුමන්ට ස්තුති ලිපියක් යැවීම සුදුසු වේ. අප ප්‍රදේශයෙන් ජාතික තලයට ගිය ක්‍රීඩකයින් පුහුණුවීම සිදු කරන ලද්දේ මෙකී ක්‍රීඩාංගනයේය. ඉදිරියටත් අප ප්‍රදේශයෙන් ජාතික තලයට ක්‍රිඩකයින් යොමු කිරීමට ඔවුන්ට පුහුණුවීම් කිරීම සඳහා මෙම ක්‍රීඩාගනය කිසිදු හානියකින් තොරව තබා ගත යුතුය.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජීත ප්‍රියදර්ශන මහතා</u>**

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සංගීත ප්‍රසංග සඳහා සහ වෙනත් උත්සව කටයුතු සඳහා ලබා නොදීමට මීට පෙර ලබා ගන්නා ලද මහා සභා තීරණය මහා සභාව විසින් ගන්නා ලද ඓතිහාසික තීන්දුවකි. මෙකී තීරණය අප පාලන කාලය තුළ ද ලබා ගත්තද, එම කාලයේ බලෙන් රැස්වීම් පැවැත්වීම සිදු කරන ලදී. නැවතත් මේ සම්බන්ධයෙන් මහා සභා තීරණයක් ලබා ගෙන, එමගින් ක්‍රීඩා කටයුතුවලට පමණක් හැර වෙනත් කිසිදු කටයුත්තක් සඳහා ලබා නොදීමට තීරණය කරන ලදී. එලෙසට ගන්නා ලද මහා සභා තීරණයක් නොසලකා හැර කටයුතු කිරීම මහා සභාවද හැල්ලුවට ලක් කරන කරුණකි. ජාතික තලයේ ක්‍රීඩා තරඟ සඳහා පුහුණුවන දරුවන් මෙකී ක්‍රීඩාංගනයේ පුහුණුවීම් කරනු ලබයි. එසේම ජාතික තලයට ගිය ක්‍රීඩකයින්ද පුහුණුවීම් කරන ලද්දේ මෙම ක්‍රීඩාංගනයේය. එම නිසා ක්‍රීඩා කරන දරුවන් සඳහා කිසිදු බාධාවකින් තොරව මෙම ක්‍රීඩාංගනයේ ක්‍රීඩා කිරීම සඳහා එකී මහා සභා තීරණය ලබා ගෙන මෙම ක්‍රීඩාංගනය ක්‍රීඩා කරන දරුවන් සඳහා පමණක්ම දායාද කිරීමට තීරණයක් ගන්නා ලදී. තවද, මෙම ක්‍රීඩාංගනය වෙනත් කටයුතු සඳහා ලබා දුන්හොත්, ක්‍රීඩාංගනය විනාශ වූ පසුව එමගින් දරුවන්ට සිදුවන හානිය නිසා අප මේ සඳහා විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී. සංගීත ප්‍රසංග සඳහාත්, වෙනත් උත්සව කටයුතු පැවැත්වීම සඳහාත් පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය ලබා දීමට නම් කරන ලදී. එය එසේ සිදු කර තිබියදීත් ජාතික තලයේ ක්‍රීඩා කරන දරුවන් සඳහා පුහුණුවීමට ඇති මෙම ක්‍රීඩාංගනයේ සංගීත ප්‍රසංග පැවැත්වීම සම්බන්ධයෙන් අප විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා</u>**

දෙබරවැව ක්‍රීඩාංගනය ජාතික තලයට ක්‍රීඩකයින් යොමු කිරීම සඳහා දරුවන් පුහුණුවීම් සිදු කරනු ලබන ක්‍රීඩාංගනයකි. එලෙස පුහුණුවීම් සිදු කරනු ලබන මෙම ක්‍රීඩාංගනයට කිසිදු හානියක් සිදු වන පරිදි, විනාශ වීමට ඉඩ නොදිය යුතුය. එම නිසා මෙම ක්‍රීඩාංගනය නඩත්තු කටයුතු සිදු වන කාලයට පමණක්ම සංගීත ප්‍රසංග සඳහා ලබා දීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>**

කොරෝනා වසංගත තත්ත්වය නිසා, මුළු රටක්ම වසර 02 ක පමණ කාලයක් සම්පූර්ණයෙන්ම අඩපණ වී, පීඩනයට පත් වී සිටින කාලයක් තුළ, තරුණ පරපුරේද ඉදිරි කටයුතු මෙම කාලය තුළ අඩපණ අකර්මන්‍ය වී තිබුණි. අතිගරු ජනාධිපතිතුමා මෙම රට භාරගත් අවස්ථාවේ දී රට පුරාම සෑම තාප්පයකම ආදර්ශවත් චිත්‍ර ඇඳීමට තරුණ පරපුරේ මැදිහත්වීම ලබා ගැනීමෙන් එම තරුණ පරපුරේ ජවය රටටම පෙන්වීමට ඔවුන්ට හැකි විය. එවැනි ජව සම්පන්න තරුණ පරපුරේ මානසිකත්වය ද මෙම කොරෝනා වසංගත තත්ත්වයත් සමඟ බිඳී ගොස් ඇත. ගොවි ජනතාව, තරුණ පිරිස, රාජ්‍ය නිලධාරීන්ද, ධීවර ප්‍රජාව ආදී සියලුම දෙනාද මානසික අතින් බිඳ වැටී තිබූ කාලයක් ලෙස මෙම වසර 02 දැක්විය හැකිය. කොරෝනා වසංගතය වැළඳුනු අයගේ මානසික සුවය පතා ත්‍රිවිධ හමුදා නිලධාරීන් එම ස්ථාන වෙත ගොස් සංගීතයෙන් ඔවුන්ව සතුටු කරවීම රට පුරාම සිදු කරන ලදී. තරුණ පරපුර මානසික අතින් වැටී ඇති අවස්ථාවකදී, තිස්සමහාරාමයේ තරුණ පරපුරේ ද බිඳ වැටී ඇති මානසික තත්ත්වය නැවත ගොඩනැංවීම සඳහා මෙලෙසට සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. සංගීතය ගත් කළ විටෙක ඖෂධයක් සේම, මානසික සුවය ලැබෙන දෙයක් ලෙස සඳහන් කළ හැකිය. එක් අතකින් තරුණ පරපුරේ බිඳ වැටී ඇති මානසිකත්වය ගොඩනැංවීම සඳහා මෙම සංගීත ප්‍රසංගය ඉවහල් වන අතර, අනෙක් පසින් ආදායම් අහිමි වූ කාලයකදී සභාවට ආදායමක් ලබා ගැනීමටත් හැකියාව පවතින බව ප්‍රකාශ කරන ලදී. ජනතාව මනසින් බිඳ වැටී ඇති කාලයක සංගීතය මගින් හෝ බිඳ වැටී ඇති සිත් සඳහා සුවයක් ගෙන දීමට මෙලෙස සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට තමා ඉල්ලීම් කළ බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා විසින් දෙබරවැව ක්‍රීඩාංගනය සම්පූර්ණ නඩත්තුවක් කිරීමට ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම ක්‍රීඩාංගනය මේ වන විට නඩත්තු කටයුත්තක පවතින බැවින්, එම නඩත්තු කාලයට පමණක්, එනම් 2022.04.30 දක්වා කාලයට පමණක් සංගීත ප්‍රසංග හා වෙනත් උත්සව කටයුතු පැවැත්වීම සඳහා අවසර ලබා දෙන බවත්, මෙම ක්‍රීඩාංගනය විධිමත් පරිදි නඩත්තු කළ පසුව කිසිදු උත්සවක් හෝ සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට අවසර ලබා නොදෙන බවත්, එකී නඩත්තු කාලයෙන් පසුව ක්‍රීඩා කටයුතු සඳහා පමණක් දෙබරවැව පොදු ක්‍රීඩාංගනය ලබා දීමටත් තීරණය විය.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම</u>**

ඉතිහාසයේ දෙබරවැව මධ්‍ය මහා විදුහල් ගොඩනැගිල්ලක් සකස් කර සංවර්ධන කටයුතු කරන ලද්දේ අප පරම්පරාවේ සීයා කෙනෙක් වන බවත්, එම කාලයේ සේනානායක නමින් නම් කර තිබූ පාසල පසුව දෙබරවැව මධ්‍ය මහා විදුහල ලෙස නම් කර ඇති බවත්, එලෙසටම දෙබරවැව ක්‍රීඩාගනය නම් කිරීමත් සිදු වී ඇති බව කිව හැකිය.

අතිගරු ජනාධිපතිතුමාගේ දැක්ම අනුව අප සියලුම දෙනාම රට ගොඩනැගීමට එතුමන්ට සහාය ලබා දිය යුතු වුවත්, මේ වන විට රටේ ජනතාවට සිදු වන අඩුපාඩුකම්, ගැටළු පිළිබඳව ඉහල තලයේ නායකයින්ව, ප්‍රාදේශීය සභා මට්ටමින් හෝ දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. ඒ හරහා අතිගරු ජනාධිපතිතුමාට ජනතාවගේ ගැටළු අඩුපාඩුකම් දැනීම සිදු වීම මත, ජනතාවට සහනයක් ලබා දීමට හෝ ක්‍රියාත්මක වනු ඇතැයි සිතිය හැකිය. අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය නිවැරදි දෙයකි. නමුත් ඊට අදාළ කටයුතු සිදු කිරීමේ දී නිලධාරීන් අතින් සිදු වන ප්‍රමාදයන් හා අඩුපාඩුකම් නිසා එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් හි ගැටළු පවතී. එම නිසා නිලධාරීන් අතින් සිදුවන අඩුපාඩු නිසා ජනතාව පීඩනයට පත් වීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීමට කටයුතු කිරීම සුදුසු වේ.

ලැබුවා වූ 2022 නව වසර සියලුම දෙනාට කායික මානසික සුවය ලැබෙන කුහක සිත් නැති වී මෛත්‍රී සිත් ඇතිවන සුභම සුභ නව වසරක් වේවා ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය අදහස් දැක්වීම</u>**

තම මෑණියන්ගේ අභාවයේ දී එම කටයුතු සිදු කර ගෙන යාමට සහාය ලබා දුන් ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින් වෙත ස්තුතිය පුද කරන ලදී.

තමා වෙත කොරෝනා රෝගය වැළදී සිටි අවස්ථාවේ දී තමා විපක්ෂයේ සභිකයෙකු වුවත්, එම අවස්ථාවේ දී තමා සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය උදව් උපකාර කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ගෞරවණීය ස්තුතිය පුද කරන අතර, ඒ සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින්ටත් ස්තුතිය පුද කරන ලදී.

මේ වන විට අප ප්‍රදේශයන්හි ජනතාව ඇතැම් කරුණු නිසා දැඩි පීඩනයකට පත්වී සිටී. ඔවුන් පත්වී සිටින මෙම පීඩනයෙන් ඔවුන්ව මුදවා ගැනීමට හැකි නම් එය ජනතාව වෙනුවෙන් සිදු කරන උතුම් කාර්යයක් වනු ඇත. එම නිසා ජනතාව වෙත යම් සහනයක් ලබා දීමට හැකි නම්, ඒ සඳහා මැදිහත් වී කටයුතු කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

මාර්ගයන් අල්ලා වැටවල් ගැසීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සිදු කරන්නේ නම්, එය ඉතාමත් හොඳ තීරණයකි. මෙවැනි ගැටළු අප ප්‍රදේශයන්වල ද තිබෙනු ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් සොයා බලා ඊට අදාළ කටයුතු සිදු කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ අදහස් දැක්වීම</u>**

තම කොට්ඨාසයේ අතුරු මාර්ගයන්හි ගමන් කිරීමට නොහැකි ලෙසට වළවල් හැරී අබලන් තත්ත්වයට පත්ව ඇත. එම නිසා මෙකී මාර්ගයන්හි බොරලු යොදා සංවර්ධනය කර දෙන තෙක්, ගමන් කිරීමට හැකි වන ලෙසට එකී මාර්ගයන්හි වළවල් ගොඩ කර හෝ දීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

කොට්ඨාසයන්ට විදී පහන් අවශ්‍යතාවයන් බොහෝ ප්‍රමාණයක් තිබෙනු ඇත. මේ සම්බන්ධයෙන් ගරු වාරිමාර්ග අමාත්‍යතුමාගේ පුතණුවන් වන ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා සමග තමා සාකච්ඡා කළ පසුව, ගරු එතුමන්ගේ විමධ්‍යගත ප්‍රතිපාදන මුදලින් දිස්ත්‍රික්කයේ පවතින සියලුම ප්‍රාදේශීය සභාවල කොට්ඨාස සඳහා විදී පහන් 10 ක් 15 ක් වන සේ ලබා දීමට කටයුතු කරන බව ගරු එතුමන් විසින් දැන්වූ බැවින්, මේ සම්බන්ධයෙන් නැවත විමසා බලන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

රට වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා සිදු කරන්නා වූ ඉදිරි වැඩපිළිවෙල සඳහා අප සියලුම දෙනාගේ සහාය ලබා දිය යුතුය. එසේම සභාවේ ඉදිරි කටයුතු සාර්ථකව සිදු කර ගෙන යාමට සියලුම දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>කොට්ඨාස 13 හිම, එක් කොට්ඨාසයක නඩත්තු කළ යුතු තත්ත්වයේ පවතින මීටර් 500 ක දුර ප්‍රමාණය ඇති එක් මාර්ගයක් සකස් කිරීමට තීරණය කර ඇති බැවින්, සියලුම ගරු සභිකයින් තම කොට්ඨාසයේ මීටර් 500 ක දුර ප්‍රමණයක් පවතින මාර්ගයක් නම් කර සභාවට ලබා දෙන ලෙසට දන්වා සිටින ලදී.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>**

අප ප්‍රදේශයේ පවතින වන අලි ප්‍රශ්නය විසඳීමක් නොලැබෙන දීර්ඝ කාලීනව පවතින ගැටළුවකි. පසුගිය දිනක වන අලීන් 02 කු හට ජීවිතයෙන් සමු ගැනීමට සිදු විය. ගම්මානවලට පැමිණෙන මෙම වන අලීන් නිසා සිදු වන අලි මිනිස් ගැටුම නවතා දැමීමට වනජීවී නිලධාරීන් විසින් කටයුතු සිදු නොකරනු ලබයි. එම නිලධාරීන් විසින් වන අලීන් ගම්වැදීම නවතා දැමීම සඳහා ඔවුන්ට පැවරී ඇති රාජකාරිය ඉටු කරන්නේ නම්, වන අලීන් ගම් වැදීම අවම කර ගත හැකිය. මෙමගින් පැහැදිලි වන්නේ එම නිලධාරීන් ඔවුන්ට පැවරී ඇති රාජකාරීය නිසි ලෙස ඉටු නොකරන බවයි. නිලධාරීන්ගේ අනවබෝධය නිසා මෙකී කටයුතු සිදු වනු ලබයි. විදුලිය වැට කඩා ගනිමින් වන අලීන් ගමට පැමිණීම සිදු වූ පසුව, එම විදුලි වැට සකස් කිරීමට වනජීවී නිලධාරීන් කටයුතු නොකිරීම නිසා, වන අලීන් දිගින් දිගටම ගම්වලට පැමිණීම සිදු වේ. විදුලි වැට නඩත්තු කටයුතු සිදු කිරීමට ස්වේච්ඡාවෙන් ගොවි සංවිධාන නිලධාරීන් එකඟතාවය ලබා දී තිබුණද එය මේ දක්වා ක්‍රියාත්මක වීමට කටයුතු සිදු වී නොමැත. එම නිසා වන අලීන් ගම්වැදීම අවම කිරීම සඳහා දැනට තිබෙන විදුලි වැට සක්‍රීය කර දීමට කටයුතු සිදු කර ගත යුතුය.

පාරිභෝගික අධිකාරිය කිසිදු පරීක්ෂාවක් සිදු නොකර නිසා, වෙළඳසැල්වල බඩු විවිධ විවිධ මිළ ගණන් යටතේ අළෙවි කරනු ලබයි. මේ දිනවල සිමෙන්ති රු. 1,800.00 ක් වැනි මුදලකට මිලදී ගැනීමට ජනතාවට සිදුව ඇත. ජනතාවට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ දී දිනෙන් දින භාණ්ඩ වල මිළ ඉහල යාමත් සමඟ ජනතාව දැඩි පීඩනයකටත් අසරණභාවයකටත් ලක්ව ඇත. මේ සම්බන්ධයෙන් පාරිභෝගික අධිකාරිය විසින් කිසිදු සොයා බැලීමක් සිදු නොකර, ඔවුන්ගේ රාජකාරිය පැහැර හැරීම සිදු කරනු ලබයි. පාරිභෝගික අධිකාරිය විසින් වෙළඳසැල් වටලා ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කළද, එම වෙළඳසැල්, ආයතන විසින් නිලධාරීන් වෙත අල්ලස් ලබා දී එම කාර්යෙන් මිදීමට කටයුතු කරන බැවින්, මෙලෙසට අල්ලස් ලබා ගන්නා නිලධාරීන් සම්බන්ධයෙන් සොයා බලා නීතිමය කටයුතු කළ යුතු බව දන්වා සිටින ලදී.

රට තුළ මුදල් අහිමි වීම නිසාත්, රට අස්ථාවරභාවයකට පත් කර භාර දීම නිසාත්, අතිගරු ජනාධිපතිතුමා හට රට වෙනුවෙන් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඉදිරි ගමනක් යාමාට බාධා ඇති වී ඇති බව ප්‍රකාශ කරන ලදී.

උද්ධකන්දර ප්‍රදේශයේ පවතින අබලන් මාර්ග සකස් කිරීම සඳහා මෝටර් ග්‍රේඩරය ලබා දෙන ලෙසට ඉල්ලා සිටියද, මෙතෙක් එකී මාර්ග නඩත්තු කර ගැනීමට නොහැකි වී ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

මාර්ගයන්හි පවතින විදී පහන් පාන්දර වන විට නිමා දැමීම සිදු නොකළහොත්, එම විදී පහන් ගලවා ගෙන යන බවට විදුලි බල මණ්ඩලය විසින් තීරණයක් ගෙන ඇත්නම්, ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට ප්‍රචාරන කටයුත්තක් සිදු කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>නිවාස අවට සුද්ධ පවිත්‍ර කර ගන්නා ලෙසත්, වැට මායිම් සුද්ධ කර ගන්නා ලෙසත්, ප්ලාස්ටික්, බෝතල් ටිං ආදී ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් එකතු කර තබා ගන්නා ලෙසටත් සහ මාර්ගයන්හි ස්ථාපිත කර ඇති විදුලි කණුවල ඇති විදී ලාම්පු පාන්දර වන විට නිමා දැමීම සිදු නොකලහොත්, එම විදී පහන් විදුලි බල මණ්ඩලය වෙතින් ඉවත් කර ගැනීමට කටයුතු සිදු කරන බවට ජනතාව දැනුවත් කිරීම කළ යුතු බැවින්, ඒ සදහා ප්‍රචාරණ කටයුත්තක් සංවිධානය කිරීමට තීරණය විය.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>**

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම අනුව, අයවැයෙන් වැඩ ලක්ෂයක් වැඩසටහන යටතේ තම කොට්ඨාසයේ මහසෙන්පුර උප නගරය සඳහා මුල් ගල තැබීමේ උත්සවය 2022.02.03 වන දින සිදු කරන බැවින්, සියලුම දෙනා ඒ සදහා සහභාගී වන ලෙසට අරාධනා කරන ලදී. මෙම ව්‍යාපෘතිය තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මැදිහත් වී සිදු කරන ලද විශාල සංවර්ධන කාර්යයක් ලෙස කිව හැකිය. එසේම මෙම ව්‍යාපෘතිය සඳහා ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ විමධ්‍යගත ප්‍රතිපාදන මුදල් ද වෙන් කර දී ඇති බවත්, එම ප්‍රතිපාදන මුදල් ලබා ගැනීම සදහා මැදිහත් වී කටයුතු කළ ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

රට තුළ සිදු වු සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය, කොවිඩ් රෝගී තත්ත්වය නිසා රට බොහෝ ලෙසට අකර්මන්‍ය තත්ත්වයකට පත් වී තිබුණි. එලෙස තත්ත්වයක් උදා වී තිබු කාලයකදී මාධ්‍යයන්ගෙන් ගෑස් පිපිරීම්, පොහොර ප්‍රශ්නය පිලිබද පමණක් ප්‍රචාරය කරනු ලබයි. එය එසේ නොමැතිව අලුතින් ආරම්භ කරන ලද යම් ව්‍යාපෘතියක්, ගොවි ජනතාවගේ කෘෂිකාර්මාන්තයක්, යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යම් ප්‍රචාරයක් ලබා දෙන්නේ නම්, එමගින් එකී ජනතාවට රුකුලක් ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදී. මත්තල ගුවන් තොටුපලේ පසුගිය රජය කාලයේ වී ගබඩා කරන ලදී. නමුත් මේ වන විට විශාල සංචාරකයින් පිරිසක් මත්තල ගුවන් තොටුපල හරහා ලංකාවට පැමිණේ. එලෙසට ලංකාවට පැමිණෙන සංචාරකයින් මාධ්‍ය හරහා පෙන්වා, සංචාරක ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුය. එසේම මුද්‍රිත මාධ්‍යයෙන් පුවත් ප්‍රචාරය කරන අප සභාවේ කටයුතු සඳහා මාධ්‍ය අනුග්‍රහය ලබා දෙමින් කටයුතු කරන මාධ්‍යවේදීන් අගය කරන බවත්, මාධ්‍ය හරහා ඉදිරියටත් එලෙසට වටිනාකමක් ඇති වැදගත් පුවත් ප්‍රචාරය කිරීමට කටයුතු කරන ලෙසට එම මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාසයන්හි පවතින මාර්ග නම් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සාකච්ඡා වුවත්, එය ක්‍රියාත්මක නොවීය. එම නිසා මාර්ග නම් කිරීමේ වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ලැබුවා වු 2022 නව වසරේ සියලුම දෙනාට සාර්ථකව ඉදිරි කටයුතු සිදු කර ගෙන යාමට සුභාශිංසන පිරි නමන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම</u>**

තිස්සමහාරාම හම්බන්තොට ප්‍රධාන මාර්ග උරහිස පළුදු කිරීම වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදල් අය කිරීමක් සිදු කරනු ලබයි. එලෙසට පළුදු කරන ලද මාර්ග නැවත සකස් නොකිරීම නිසා අනතුරු ඇති වීමට ඉඩ තිබේ. එම නිසා මෙලෙසට පළුදු කරන ලද මාර්ග නැවත සකස් කිරීමට කටයුතු සිදු කරන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරියට ලිපියක් මගින් දන්වා යවන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගම් වදින වන අලි ගැටළුවේදී නිලධාරීන් අතින් ඊට අදාළ කටයුතු සිදු නොවන බවට වනජීවි නිලධාරීන්ට දෝෂාරෝපණ එල්ල කළද, විදුලි වැට සකස් කිරීමට අදාළ තීරණ ලබා ගත යුත්තේ දේශපාලන අධිකාරියයි. වන අලි උවදුර වළකා ගැනීමට නම් විදුලි වැට සකස් කිරීම අනිවාරයෙන්ම සිදු කළ යුතුය. නමුත්, එවැනි අත්‍යාවශ්‍ය කටයුතු සිදු කරනවා වෙනුවට රට තුළ වෙනත් කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ පැවැත්වීමට නියමිත සංගීත ප්‍රසංගය ජනතාවට මානසික සුවයක් ලබා දීම අපේක්ෂාවෙන් සිදු කරන්නේ නම්, එය නොමිලයේ පැවැත්විය යුතුය. මෙම කාලයේ ජනතාවට මානසික සුවය ලබා ගැනීමට වඩා ඔවුන් මානසික අතින් කඩා වැටී ඇති බව සඳහන් කරන ලදී.

මෙම කාලය තුළ භාණ්ඩ මිල විවිධ විවිධ මිල ගණන් යටතේ අඛණ්ඩව ඉහල යනු ලබයි. මෙකී කරුණු නිසාම පාරිභෝගික අධිකාරිය, මිල පාලන අධිකාරිය මිල පාලනයෙන් ඉවත් වී ඇත. එම නිසා ඔවුන්ට ඒ සම්බන්ධයෙන් දෝෂාරෝපණ එල්ල කිරීමක් සිදු කළ නොහැක. භාණ්ඩ නිෂ්පාදනය අඩු වී තිබියදී මුදල් අච්චු ගැසීම වැඩි වීමත් සමඟ බඩු මිල ඉහල යාම සිදු වන බව ප්‍රකාශ කරන ලදී.

රටේම ජනතාව දැනට සිදුවන කරුණු කාරණා නිසා ලක්වන පීඩනය සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා හට ද දැනෙන්නේ නම්, ජනතාවට මෙලෙස පීඩනයට ලක් වීමට සිදු නොවනු ඇත.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම**</u>

ගම්වදින වන අලීන්ගෙන් සිදුවන ගැටළුකාරී තත්ත්වය සාකච්ඡා කිරීම නිසා ප්‍රාදේශීය ලේකම්තුමිය, වනජීවි නිලධාරී හා ප්‍රාදේශීය සභාවේ ගරු සභිකයින් එක්ව 2022.01.27 වන දින රැස්වීමක් පැවැත්වීමට කටයුතු යොදා තිබීම සතුටට කරුණකි. අප ප්‍රදේශයේ මේ වන විට අලි දෙදෙනෙක් මිය ගොස් ඇත. මෙම කරුණ දුක්ඛිත එකක් වුවත්, ජනතාව ඒ සම්බන්ධයෙන් සතුටු වනවා මෙකී කරුණ නිසා හෝ මෙම වන අලි ගැටළුව සඳහා කඩිනම් විසඳුමක් ලබා ගැනීමට හැකි වේ යන බලාපොරොත්තුවෙන්.

පාරිභෝගික අධිකාරිය විසින් මිල නියම කිරීමක් සිදු නොකිරීම මත භාණ්ඩවල මිල අධික ලෙස වැඩි වී ඇත මේ දිනවල සිමෙන්ති උරයක් රු. 1,800.00 ක් වැනි වැඩි මුදලකට විකුණන බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමීල මහතාගේ අදහස් දැක්වීම**</u>

2022 වසරේ පවත්වනු ලබන මුල්ම සභා වාරයයි. 2022 වර්ෂයේ මාර්තු මාසයෙන් අප පාලන කාලය අවසන් වීමට තිබියදී, අපගේ පාලන කාලය තවත් වසරකින් දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ගරු පළාත් පාලන අමාත්‍යතුමාට ස්තූතිය පුද කළ යුතුය. අප පත් වූ දින සිට යහපාලන ආණ්ඩුවත් සමඟ වැඩ කිරීමට සිදු විය. ඉන් අනතුරුව රටේ ඇති වූ සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය නිසාත්, කොවිඩ් වසංගත තත්ත්වය නිසාත්, අප පාලන කාලය තුළ වැඩ බොහෝ ප්‍රමාණයක් සිදු කර ගැනීමට නොහැකි විය. රටේ පැවැති විවිධ තත්ත්වයන් නිසා අපට සිදු කර ගැනීමට නොහැකි වූ කාර්යයන් සිදු කර ගැනීම සඳහා අපගේ පාලන කාලය වසරකින් දීර්ඝ කිරීම පිළිබඳ සතුටු වන බව ප්‍රකාශ කරන ලදී.

අප රට තුළ එන්නත්කරණ කටයුතු සිදු කිරීම ආරම්භ කිරීමේ දී විපක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම එන්නත්කරණ වැඩසටහන සාර්ථක නොවන බවත්, එමගින් කොරෝනා වසංගතය

පාලනය කළ නොහැකි බවත්ය. නමුත් මේ වන විට එන්නත් 03 ලබා ගැනීමට රටේ ජනතාව යොමු වීම නිසා කොරෝනා මරණ සංඛ්‍යාව විශාල ලෙස අඩු වී ඇත. මෙලෙසට අතිගරු ජනාධිපතිතුමා විසින් අප රට තුළ ක්‍රියාත්මක කරන ලද එන්නත්කරණ වැඩසටහන සාර්ථකව සිදු කිරීමට හැකි වූ බවත්, අප රට තුළ එන්නත්කරණ වැඩසටහන සාර්ථකව සිදු කර ඇති බවට විද්‍යුත් මාධ්‍යවලින් ද දැක ගැනීමට හැකි වූ බව ප්‍රකාශ කරන ලදී.

මාගම මෝදරපැලැස්ස විදුලි වැට ඉදිකිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේත්, පුවත්පත් දැන්වීම්වලින් ද අවධානය යොමු වුවත්, මෙම විදුලි වැට ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත. විදුලි වැට සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දී ඇති බවට ගරු අමාත්‍යතුමා විසින් දන්වා සිටියදීත්, මෙම විදුලි වැට ඉදිකිරීමේ කටයුතු අතරමඟ නතර වී ඇත්තේ කුමන හේතුවක් නිසාද යන්න ගැටළුවක් පවතී. නිලධාරීන් විසින් ඔවුන්ගේ රාජකාරී නිසි ලෙස ඉටු නොකරීම නිසා මෙම විදුලි වැට සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වන බව කිව හැකිය. විදුලි වැට සකස් කිරීමට අදාළ භූමිය නිදහස් කර දෙන ලෙසට ප්‍රකාශ කළ පසුව ප්‍රාදේශීය ලේකම් විසින් එකී භූමිය නිදහස් කර දෙන ලදී. එසේම විදුලි වැට සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා දෙන ලෙසට ඉල්ලූ පසුව ගරු වාරිමාර්ග අමාත්‍යතුමා විසින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කර, ඊට අදාළ අමු ද්‍රව්‍ය ද ලබා දීමට කටයුතු කරන ලදී. එය එසේ සිදු වී තිබියදීත් විදුලි වැට ඉදිකිරීමේ කටයුතු තවමත් ආරම්භ නොකිරීම ගැටළුකාරී තත්ත්වයකි. එම නිසා සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කර, විදුලි වැට සකස් කර ගැනීමට අදාළ කටයුතු සිදු කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

ලැබුවා වූ 2022 නව වසර සියලුම දෙනාට ඉදිරි කටයුතු සාර්ථකව සිදු කර ගත හැකි සාර්ථක වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම</u>**

ගරු සභාපතිතුමාගේ පුතණුවන් රෝගාතුර වී සිටි අවස්ථාවේ දී එම දරුවාට සුවය ප්‍රාර්ථනා කර තුණුරුවන්ගේ ආශිර්වාදය, දළදා හාමුදුරුවන්ගේ ආශිර්වාදය, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආශිර්වාදය ලබා ගන්නා ලදී. ඊට අමතරව ගරු සභිකයින්, කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හා ප්‍රදේශයේ ජනතාව විසින් ද එම දරුවාට සුවය ප්‍රාර්ථනා කර බෝධි පූජා පිංකම් සිදු කරන ලදී. මෙකී සියලු ආශිර්වාද මැද හා දේශපාලන නායකයින්ගේ ද ආශිර්වාද මැද ගරු සභාපතිතුමාගේ පුතණුවන් සුව අතට පත් වී සිටීම අප සියලුම දෙනාගේ සිතට සතුටු විය හැකි කරුණකි. එසේම එම පුතණුවන්ට ඉදිරි අනාගතයේ ද නිදුකින් නීරෝගීව සිටීමට තුණුරුවන්ගේ ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2021 වසර විවිධ කරුණු කාරණා රැසක් නිසා කිරියෙන් පැණියෙන් ඉතිරීමට නොහැකි විය. එසේම ලැබුවා වූ 2022 නව වසර ද කිරියෙන් පැණියෙන් ඉතිරීමට නොහැකි වුවත්, ජන ජීවිතය යථා තත්වයට පත් කර ගන්නා තිබෙන අවස්ථා වැඩි දියුණු වේවා සහ තුණුරුවන්ගේ ආශිර්වාදයෙන් විශ්ව ශක්තියේ ආශිර්වාදයෙන් සියලු කරුණු කාරණා යහපත් තත්ත්වයකට පත් වී රටවාසි ලෝකවාසි සියලුම දෙනාට යහපතක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අප සියලුම දෙනා සභාව නියෝජනය කරනු ලබන්නේ තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන්ය. ජාතික තලයේ දේශපාලනය පිළිබඳ අප දේශපාලන නායකයින් විසින් පාර්ලිමේන්තුවේ කතා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි. එම නිසා අප සෑම අවස්ථාවකදීම මහා සභාවේදී තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් පෙනී සිට කටයුතු කළ යුතුය.

ප්‍රදේශයේ පවතින මාලු ලැලි ඉවත් කිරීම සම්බන්ධව හා නගර අලංකරණයට හානිදායක කරුණු, ලේක් සයිඩ් හෝටලය අසල තිබෙන කඩ කාමර කිහිපය ඉවත් කිරීම සම්බන්ධයෙන් අද

දින කරුණු සාකච්ඡා කරන ලදී. මාගම්පුර රාජධානියේ තිස්සමහාරාම නගරය මුදුන් මල්කඩ වැනි තිස්සමහාරාම විහාරස්ථානය පිහිටි භූමිය අලංකාරණයෙන් තබා ගැනීම සභාව සතු වගකීමකි. නමුත් මාලු ලැලිවල වෙළදාම් කරන්නේද, ලේක් සයිඩ් හෝටලය අසල ටකරන් කඩවල්හි වෙළදාම් කරන්නේද තිස්සමහාරාමයේම ජනතාවයි. ඔවුන් කිසිදු වංචනික ක්‍රියාවන් සිදු නොකර, මෙලෙස කුඩා වෙළදාමක් සිදු කර ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග සකස් කර ගෙන තිබීම අප අගය කළ යුතුය. මු ඇට සාධාරණ මිලකට මිලදී ගැනීම සඳහා කටයුතු කරන ලෙසට ගරු වාර්මාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා සමඟ සාකච්ඡා කර, ඒ අනුව එකී පණිවිඩය අතිගරු ජනාධිපතිතුමා වෙත දැනගැනීමට ලැබුණු නිසා, මුං ඇට සාධාරණ මිලකට ලබා ගැනීමට වැඩපිළිවෙල සකස් වුණි. ඒ අනුව ඉහත කී කාර්යයන් සඳහා ද දේශපාලන නායකයින් සම්බන්ධීකරණය කර ගනිමින්, මෙකී කරුණු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට හැකිවන පරිදි වැඩපිළිවෙලක් සකස් කර දිය යුතුය.

වැව් රක්ෂිතය සහ මාර්ග රක්ෂිත 02 ක් අසල ලේක් සයිඩ් හෝටලය අසල තිබෙන කඩ පවත්වාගෙන යනු ලබයි. එම ස්ථානයේ අලුතින් ඉදි කර ඇති කඩ කාමර අසල වාර්මාර්ග කාර්යාලයට අයත් බිම් කොටස් 02 තිබේ. එම බිම් කොටස් 02 න් 01 ක් බිම් කොටසක් නිදහස් කර ගැනීමට හැකි නම්, ලේක් සයිඩ් හෝටලය ඉදිරිපිට ඇති ටකරන් කඩ කාමරවල දීර්ඝ කාලයක් තිස්සේ සිටින අයවලුන් සඳහා කඩ කාමර කිහිපයක් සකස් කර දී එය සභාවට පවරා ගැනීමට හැකි නම් එය වඩාත් හොඳ ක්‍රියාවක් වනු ඇත. එබැවින්, මේ සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කරවන ලෙසටත්, මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු වාරිමාර්ග අමාත්‍යතුමා, ගරු ක්‍රීඩා අමාත්‍යතුමා වෙත දන්වා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බවටත් දන්වා සිටින ලදී.

යෝධ වැව සුරැකීමේ කාර්ය භාර්ය අප සියලුම දෙනා සතුව තිබේ. අතීතයේ රජවරුන්ගේ කාලයේ සිට රැක ගෙන යා මෙම වැව් විනාශ වීම සිදු වන්නේ නම්, එය මහත් විනාශයකි. එම නිසා තිස්ස වැවත් රක්ෂිතයත් අතර පාරක් සකස් කළා සේම ගරු වාරිමාර්ග අමාත්‍යතුමා වෙත දන්වා යෝධ වැව වටාද පාරක් සකස් කිරීමට කටයුතු කරන්නේ නම් වැව් රක්ෂිතය ආරක්ෂා කර ගත හැකිය. වැව වටාම පවතින්නේ රජයේ ඉඩමිය. එම නිසා මෙම කාර්යය සිදු කළ හැකිය. සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරද පවත්වාගෙන යා යුතුය. එසේ ව්‍යාපාරයන්ද, සංචාරක ක්ෂේත්‍රයද තිබිය යුතු වුවත්, ඒ සියලු දේටම ප්‍රධාන වශයෙන් අප මූලිකත්වය දිය යුත්තේ වැව ආරක්ෂා කර ගැනීමට බව සඳහන් කරන ලදී.

රබර්වත්ත වසමේ රබර්වත්ත ජයසිරි මාවත දක්වා ඇති සමගි මාවත එක් පැත්තක් සම්පූර්ණයෙන්ම ගිලා බැසීම නිසා මෙම මාර්ගය ගමන් කිරීමට නොහැකි ලෙසට පත්ව ඇත. මෙම මාර්ගය සභාව විසින් කැටගල් අල්ලා සංවර්ධනය කර තිබුණද, සම්පූර්ණයෙන් එක් පැත්තක ජලය රැඳී තිබීම නිසා වගුරු බිමක් බවට පත්ව ඇත. එම නිසා මෙම මාර්ගය ජනතාවට ගමන් කිරීමට හැකි වන පරිදි සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

කොවිඩ්-19 එන්නත් ලබා දීම වෙනුවෙන් අප රට ලෝකයෙන්ම 03 වන ස්ථානය බවට පත්ව ඇත. ඒ සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අප සතුටු වන බව ප්‍රකාශ කරන ලදී. එන්නත් 02 ලබා ඇති පුද්ගලයින් අතරින් බූස්ටර් එන්නත ලබා ගෙන ඇත්තේ 30% ක පමණ ප්‍රමාණයක්ය. අප රට තුලත් කොරෝනා ඔමික්රෝන් ප්‍රභේදය ව්‍යාප්තවෙමින් පවතී. මෙම ප්‍රභේදය දකුණේ ද ව්‍යාප්ත වීම ඉදිරියේ දැඩි ලෙස සිදු විය හැකි බැවින්, මෙම ප්‍රභේදයෙන් අප තිස්සමහාරාමයේ පුරවැසියන් රැක ගැනීම සඳහා මෙම ඔමික්රෝන් ප්‍රභේදයට මුහුණ දීමට හැකි බූස්ටර් එන්නත ලබා දීමට කටයුතු කළ යුතුය. ලංකාව පුරාම බූස්ටර් එන්නත ලබා ගෙන නොමැති ඉතිරි 70% ක ප්‍රමාණයටත් මෙම එන්නත ලබා දීමට කටයුතු කළ යුතුය. කොවිඩ්-19 එන්නත් 02 ලබා දීම සඳහා ගරු සභාපතිතුමා ඇතුළුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මැදිහත් වී කටයුතු

සිදු කළා සේම, මෙම බූස්ටර් එන්නතක් කඩිනමින් තිස්සමහාරාමයේ ජනතාවට ලබා දීමටත් කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී. තවද, බූස්ටර් එන්නත ලබා ගැනීමට ජනතාව මැලි කමක් දක්වන්නේ මෙම එන්නත මගින් වෙනත් රෝගවලට ඉදිරියේ මුහුණ දීමට සිදුවනවා යන මතය නිසාය. එම නිසා ප්‍රථමයෙන් ජනතාව මේ සම්බන්ධයෙන් ඇති බිය දුරු කරවීමට කටයුතු කර, එන්නත ලබා දීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

ලැබුවා වූ 2022 නව වසර ජන ජීවිතය යථා තත්ත්වයට පත් කර ගැනීමට හැකි වන සාර්ථක සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම**

ගොවි ජනතාව විසින් සිදු කරන ලද වී වගාවේ අස්වනු ඉදිරියේ නෙලා ගැනීමට හැකි වනු ඇත. රජයෙන්ම වී අස්වැන්නට සාධාරණ මිලක් ලබා දෙන බවට ප්‍රකාශ කළ බැවින්, වී අස්වනු නෙලන කාලයේදී එම ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී සාකච්ඡා කර ගොවි ජනතාවගේ වී අස්වනු සඳහා සාධාරණ මිලක් ලබා දීමට කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී. එසේ සිදු නොවුනහොත් මෝල් හිමියන් විසින් ඉතාමත් අඩු මිලකට ගොවි ජනතාවගේ වී ලබා ගැනීම සිදු විය හැකිය.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග තිස්සමහාරාම ප්‍රදේශයේ පවතී. මෙම මාර්ග දෙපස ඇති ගස්වල අතු මාර්ගය දෙසට වැවී ඇති බැවින්, මෙම ගස් කපා ඉවත් කරන දෙන ලෙසට එම ආයතනයෙන් ඉල්ලීමක් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

වැලිපොතේවල යෝධකණ්ඩිය හන්දියේ සිට අන්දරගස්යාය දක්වා මාර්ගයේ වැඩ මේ වන විට නිම කර තිබුණද, එම මාර්ගයේ ස්ථාන කිහිපයක මාර්ගයට අවහිර වන සේ සහ අනතුරුදායක ලෙස විදුලි කණු සහ දුරකතන කණු පිහිටා ඇති බැවින්, මෙම කණු ඉවත් කර දෙන ලෙසට විදුලි බල මණ්ඩලය හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය දැනුවත් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

සභාවට ආදායම් මාර්ගයක් ලැබෙන පරිදි සහ ගොවි ජනතාවට සාධාරණ මුදලකට කෘෂි නිෂ්පාදන ලබා ගැනීමට හැකි වන පරිදි, තිස්සමහාරාමයේ කෘෂි නිෂ්පාදන අළෙවි සැලක් ආරම්භ කිරීම සුදුසු වන බැවින්, මේ සඳහා තිස්සමහාරාම ආයුර්වේද මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ ඇති පරණ ගොඩනැගිල්ලේ යොදා ගැනීම සුදුසු වන බැවින්, මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා සමඟ සහ ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා සමඟ සාකච්ඡා කර, අදාළ කටයුතු සිදු කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

1996.1019 වන දින ගරු චමල් රාජපක්ෂ මැතිතුමා සහ දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමා, වනජීවී අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සියලු දෙනා එක්ව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ගොඩේ කලපුවේ සිට විදුලි වැට ඉදි කිරීම සිදු කරන ලදී. එසේ සිදු කළ විදුලි වැට නිලධාරීන්ගේ කිසිදු නඩත්තුවක් නොමැති නිසා අක්‍රීය වන ලදී. නමුත් ඉන්පසුව එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවේ සිටි ගරු අමාත්‍යවරයෙකු විසින් කිසිදු කෙනෙකුගේ අදහස් ලබා නොගනිමින් ගැසට් නිවේදනයක් ගසන ලදී. කරුණු එසේ වුවත්, මෙම ප්‍රදේශයේ තිබුණු විදුලි වැට සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. විදුලි වැට නොමැතිව අලි මිනිස් ගැටුම කිසිදු දිනක නවතාලිය නොහැක. ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින් හා ගොවි සංවිධාන නිලධාරීන් එක්ව වනජීවී අධ්‍යක්ෂ ජනරාල්තුමා සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ අදහස් දැක්වීම**

තම කොට්ඨාසයට ද මෙම වන අලි උවදුර දැඩි වශයෙන් තිබේ. එක් දිනක කොට්ඨාසයේ එක් ගම්මානයක් සඳහා තුන්පත් රෑනම පැමිණ ඇත. වනජීවී නිලධාරීන්ට මේ පිළිබඳව දැන්වූ

පසුවත් ඔවුන් එම අවස්ථාවේ පැමිණීම සිදු නොකරයි. නමුත් එම නිලධාරීන්ට වාසි වන වෙනයම් කාර්යයක් සම්බන්ධයෙන් දැන්වුවහොත් ඒ සඳහා විනාඩි 20-30 පැමිණෙයි. ගම්වදින වන අලින් පැමිණි පසුව එම සතුන් කැළෑවට එළවා දැමීමට කටයුතු කිරීම එම නිලධාරීන් සතු රාජකාරියක් වුවත්, එම නිලධාරීන් ඔවුන්ගේ රාජකාරිය නිසි පරිදි ඉටු නොකරයි. පත් වන ලද සෑම රජයක් විසින්ම විදුලි වැටවල් සකස් කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කළත්, කුමන හෝ ප්‍රශ්නයක් නිසා එකී කටයුතු සිදු වීම අතරමග නතර වනු ඇත.

සිරිදහම්පල ගම්මානයේ ජනතාව එකී ගම්මානය අඳුරේ පවතින නිසා විථි පහන් කිහිපයක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කළද, රටේ පැවැති තත්ත්වයත් සමඟ සභාවේ ආදායම් අඩුවීම මත එකී ඉල්ලීම් ඉටු කර දීමට අපට නොහැකි වූ බැවින්, එම ගම්මානයේ ජනතාව ඔවුන්ගේ කණ්ඩ කර උකස් කර එම මුදලින් එම ගම්මානයේ අන්ධකාරය නැති කිරීම සඳහා විථි පහන් ලබා ගෙන ඇත.

2022.02.03 වන දින රට පුරාම සෑම කොට්ඨාසයකම එක් එක් ව්‍යාපෘති සඳහා මුල් ගල තැබීමේ සුභ කටයුත්තක් සිදු වන ලදී. තම කොට්ඨාසයේ ද එම දිනයේ දී හෙළ බොජුන් හල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මුල් ගල් තැබීමේ සුභ කටයුත්ත සිදු වන බැවින්, ඒ සඳහා පැමිණෙන දෙනට සියලුම දෙනාට අරාධනා කරන කරන ලදී.

ගම් මට්ටමින් තොරතුරු ලබා ගෙන, ගමෙහි අවශ්‍යතාවයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට අප ස්තුතිය පුද කළ යුතුය. මීට පෙර ප්‍රතිලාභ ලබා දීමේ දී අඩු ආදායම්ලාභී පවුල් සඳහා ප්‍රතිලාභ ලබා දුන්නද, අප රජය විසින් යම් ව්‍යාපෘතියක් සිදු කිරීමට හැකියාව තිබෙන පුද්ගලයින් සොයා ඔවුන්ට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීමත් විශේෂිත කරුණකි.

අප බල ප්‍රදේශයේ පවතින මාර්ගයන් බොහොමයක් කාපට් යොදා සංවර්ධනය කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් අප රජයට ප්‍රශංසා පුද කළ යුතුය.

ලැබුවා වූ 2022 නව වසර සියලුම දෙනාට නිදුක් නීරෝගී සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

පසුගිය දිනක තම පුතණුවන් බරපල රෝගී තත්ත්වයකට පත්ව සිටි අවස්ථාවේදී දරුවාට සෙත් පතා බෝධි පූජා සිදු කළ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ දේශපාලන නායකයින්ටත්, ප්‍රදේශයේ සියලුම ජනතාවටත් තම පවුලේ සියලුම දෙනා වෙනුවෙන් හෘදයාංගම ස්තුතිය පුද කරන ලදී.

තම දරුවා හදිසියේ අසනීප වූ අවස්ථාවේ දඹුල්ල රෝහලට ඇතුලත් කළ අවස්ථාවේ ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමියට දන්වා, එතුමිය ඒ සඳහා මැදිහත් වී රෝහලෙන් සිදු විය යුතු හදිසි ප්‍රතිකාර කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන ලදී. එසේම ඒ අවස්ථාවේ ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා හට පාන්දර තමා දුරකතනයෙන් දැන්වූ අවස්ථාවේ සිටම මේ සම්බන්ධයෙන් මැදිහත් වී කටයුතු කළ කරන ලදී. තම දරුවාගේ අසනීප තත්ත්වයේදී එලෙසට ගරු අමාත්‍යවරුන් දෙපල විසින් ලබා දුන් සහාය වෙනුවෙන් ගරු අමාත්‍යවරුන් දෙපලට තම ගෞරවණීය ස්තුතිය පුද කරන ලදී.

එසේම අප සභාවේ සේවය කරන ඩබ්.ජ්. දයාරත්න මහතාගේ ඥාති දරුවකු හදිසියේ අසනීප වූ අවස්ථාවක දී ද ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා සහ ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා මැදිහත් වී කටයුතු කළ නිසා, අද වන විට එම දරුවා සුව අතට පත් කර ගැනීමට හැකි වී ඇත. ගරු අමාත්‍යවරුන් දෙදෙනා තමාගේ දරුවා පිළිබඳ පමණක් නොව, ලංකාව

පුරාම සිටින දරුවන් පිළිබඳව ඕනෑකමින් සිතා බලා අවශ්‍ය කටයුතු සිදු කරන මනුෂ්‍යත්වය පිරි අමාත්‍යවරුන් දෙපලක් ලෙස දැක්විය හැකිය.

රට පුරාම සෑම ග්‍රාම නිලධාරී වසමකම ජනතාවට සහන මිලට බඩු ලබා ගැනීම සඳහා හෝම් ෂොප් නමින් කඩයක් ආරම්භ කිරීම අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ක්‍රියාත්මක කිරීමට නියමිත බව ප්‍රකාශ කරන ලදී.

දෙබරවැව පොදු වෙළඳපොළෙහි ද දුර්ගන්ධය හමන බවට පැමිණිලි ලැබී ඇත. මෙය සිදු වන්නේ රාත්‍රී කාලයේ දී අනවසර කසළ බැහැර කිරීම් සිදු කිරීම නිසාවෙන්ය. එම නිසා රාත්‍රී කාලයට හා පොළ නොමැති දිනයන්වල පොළෙහි ඉදිරිපිට ගේට්ටුව විවෘතව තිබියදී, පිටුපස ඇති අනෙක් සියලු ගේට්ටුවල ඉබි යතුරු යෙදීම සුදුසු බවටත්, මෙම තීරණය ලබා ගැනීමට පෙර වෙළඳ සංගම් සමඟ සාකච්ඡාවක් ලබා ගැනීම සුදුසු බවටත් දන්වන ලදී.

දෙබරවැව පොදු වෙළඳපොළ භූමියේ පවතින වළවල් වලට ABC යොදා සකස් කර දීමට කටයුතු කරන ලෙසට කර්මාන්ත කමිටු සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අවධානයට යොමු කරන ලදී.

ප්‍රාදේශීය සභාවේ මුරකරුවන් යොදවා ඇති ස්ථානවල එම මුරකරුවන් නිසි පරිදි රාත්‍රී මුර සේවය සිදු කරන්නේද යන්න සොයා බැලිය යුතුය. මුරකරුවන්ගේ සේවය අධීක්ෂණය කිරීම සඳහා නිලධාරියෙකු යොදවා, ඒ සඳහා ලොග් සටහන් පොතක් දැමීමට කටයුතු කළ යුතුය.

රට තුළ භාණ්ඩ මිල ගණන් ඉහල යාම සිදු වන්නේ කොරෝනා වසංගත තත්ත්වය නිසා පමණක් නොව, සෑම වසරකම මෙම කාලය තුළ බඩුවල ඉහල යාමක් සිදු වනු ඇත. මෙසේ බඩු මිල ඉහල ගියත් එකී තත්ත්වය ටිකින් ටික අඩු වනු ඇත. කොරෝනා වසංගත තත්ත්නව නිසා රට තුළ ආදායම බොහෝ පහල වැටීමක් සිදු වූ බවත්, නිසා රට නැවත යථා තත්ත්වයට පත් කර ගනිමින් රට ගොඩනැගීම සඳහා අතිගරු ජනාධිපතිතුමාට අප සියලුම දෙනා සහාය දැක්විය යුතුය.

ඉදිරි කාලය තුළ අතිගරු ජනාධිපතිතුමා විසින් රට වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද නිවැරදි වැඩපිළිවෙල සඳහා අප සියලුම දෙනා සහාය ලබා දිය යුතුය. රට ගොඩ නැගීමට නම් පාට පක්ෂ භේද නොබලා සියලුම දෙනා එක්ව කටයුතු කළ යුතුය. රටේ තිබුණු අඩුරු පැහැති පැති ඉවත් කර, රට ආලෝකමත් කිරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරි වර්ෂයන් තුළ කටයුතු සිදු කරනු ඇත. එකී වැඩපිළිවෙල සඳහා පාට පක්ෂ නොබලා අප සියලුම දෙනා සහාය ලබා දී කටයුතු කළ යුතුය. මේ සඳහා උදාහරණයක් ලෙස අප සභාවේ ගරු සභිකයින් 23 දෙනාට එකට එක්ව කටයුතු කිරීම රටටම ආදර්ශයක් ලෙස ලබා දිය හැකිය.

මහා සභාවේ දක්වන ලද අදහස් හා යෝජනා ජනතාවගේ දැන ගැනීම සඳහා සමාජ මාධ්‍ය ජාලාවල සහ පුවත්පත්වල පල කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් වෙත ස්තුතිය පුද කරන ලදී.

අප පාලන කාලය ආරම්භයේ යම් යම් ව්‍යවසන තත්ත්වයන් සඳහා මුහුණ දීමට සිදු වූ නිසා, අප හට වැඩ රාශියක් සිදු කර ගැනීමට නොහැකි විය. එසේ සිදු කර ගැනීමට නොහැකි වූ වැඩ කොටස් සිදු කර ගැනීම සඳහා අපගේ පාලන කාලය වසරකින් දීර්ඝ කර දීම සම්බන්ධයෙන් ගරු පළාත් පාලන අමාත්‍යතුමාට ස්තුතිය පුද කරන බවත්, ඒ සම්බන්ධයෙන් සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදී.

අප ප්‍රාදේශීය සභාව බැබැලී ඇත්තේ පාට පක්ෂ භේදයක් නොබලා සියලුම දෙනා එකට එක්ව කටයුතු කිරීම නිසාය. අප සභාවේ එකී ආදර්ශය රටටම ලබා දිය යුතුය. අප සභාවේ සේම මුළු රටේම ජනතාව කිසිදු පාට පක්ෂ භේදයක් නොමැතිව කටයුතු කර, රට ගොඩනැගීම සඳහා එකී සහාය අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ගරු වාරිමාර්ග

අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාටත්, ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු සියලුම දේශපාලන නායකයින්ට ලබා දිය යුතුය.

තිස්සමහාරාම උසාවිය ඉදිරිපිට ඉදි කරනු ලබන උප නගර ව්‍යාපෘතියට මුල් ගල තැබීමේ කටයුතු 2022.02.03 වන දින පෙ.ව. 08.52 යෙදෙන සුභ මොහොතින් නැගෙනහිර බලා සිදු කිරීමට නියමිත් බැවින්, එම මුල් ගල් තැබීමේ උත්සවය සඳහා පක්ෂ විපක්ෂ සියලුම දෙනාට සහභාගී වන ලෙසට ආරාධනා කරන ලදී.

ලැබුවා වූ 2022 නව වසර සියලුම දෙනාට නිදුක් නීරෝගී ව්‍යවසනයන්ගෙන් තොර සුභම සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා මාධ්‍යවේදීන් දෙපල, ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 03.30 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.01.24 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී